සියලුම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

# 23 - දේශපාලන විද්‍යාව

## ලකුණු දීමේ පටිපාටිය



Father of Political Science

මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

44. 1978 ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද 19 වන සංශෝධන යටතේ ජනාධිපතිවරයාට පැවරුණු නව කාර්යයන් හා වගකීම් වන්නේ:
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම
(2) ජාතික ප්‍රතිසංධානය සහ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම
(3) රාජ්‍ය සේවයේ දූෂණ සහ අල්ලස් තුරන් කිරීම සඳහා නව නීති පැනවීම
(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII අ පරිච්ඡේදයේ සඳහන් ආයතනවල විධිමත් ක්‍රියාකාරීත්වය සහතික කිරීම හා පහසු කිරීම
(5) නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණය නිර්මාණය කිරීම සහ තහවුරු කිරීම

- අංක 45 සිට 50 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන කවර ප්‍රකාශය දැ'යි සඳහන් කරන්න.

**අංක 1 වගුව සඳහා යොමුව**

| අංකය | ප්‍රකාශය 1 | ප්‍රකාශය 2 |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

**වගුව 1**

| | ප්‍රකාශය 1 | ප්‍රකාශය 2 |
|---|---|---|
| 45. | ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා තෝරන්නේ නියෝජිතයින් 536 දෙනෙකුගෙන් සමන්විත ඡන්ද විද්‍යාලයක් මගිනි. | වොෂින්ටන් DC හැරුණු විට අනෙක් සෑම ප්‍රාන්තයකටම ඒවායේ භූමිය සහ ජනගහනය අතර පවතින වෙනස්කම් නොසලකමින් සමාන නියෝජිත සංඛ්‍යාවක් ඡන්ද විද්‍යාලයට තෝරාපත් කිරීමේ හිමිකම ඇත. |
| 46. | බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අලිඛිත බව පොදුවේ පිළිගැනේ. එම හේතුවෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය එකක් වන බව ද පොදුවේ පිළිගැනේ. | එබැවින් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා විශේෂිත ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම අවශ්‍ය නොවන අතර එකී ව්‍යවස්ථා සංශෝධනය සාමාන්‍ය බහුතර ඡන්දයෙන් සම්මත කරගත හැකි ය. |
| 47. | ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවේ ජනාධිපතිවරයා සිව් අවුරුදු නිලකාලයක් සඳහා ඡන්ද විද්‍යාලයක් මගින් තෝරාපත් කරන අතර ඡන්ද විද්‍යාලය සමන්විත වන්නේ මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ සියලු ම මන්ත්‍රීවරුන්ගෙනි. | ඇමරිකා එක්සත් ජනපදයේ මෙන් ඉන්දියාව තුළ ජනාධිපති තනතුරට එක් පුද්ගලයෙකුට පත්විය හැකි වාර ගණන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සීමාකර නැති අතර එක් පුද්ගලයෙකුට ඕනෑම වාර ගණනක් තේරී පත් විය හැක. |
| 48. | ප්‍රංශය තුළ ආණ්ඩුවේ සියලුම සාමාජිකයින් අගමැතිවරයා විසින් තම අභිමතය පරිදි පත් කරනු ලැබේ. | ප්‍රංශයේ ආණ්ඩුව තම කාර්යයන් සම්බන්ධයෙන් ජාතික මන්ත්‍රණ සභාවට වගකිව යුතු අතර වගකීම කඩකරන විට විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් ආණ්ඩුව බලයෙන් ඉවත් කිරීමට ජාතික මන්ත්‍රණ සභාවට හැකියාව තිබේ. |
| 49. | රාජ්‍යය තුළ ජීවත් වන ජනතාවගේ සමාජ යහපත ඉහළ දැමීමේ අරමුණු ඉටු කර ගැනීම හා සම්බන්ධ ආණ්ඩුවල ක්‍රියා රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස අර්ථකථනය කළ හැක. | එම කාර්යයන් බෙදාහැරීම්, බදු අයකිරීම්, නියාමනය හා සංකේතාත්මක යනුවෙන් කොටස් හතරකට වර්ග කළ හැකි ය. |
| 50. | අන්තර්ජාතික දේශපාලනය සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ ජාතික අභිලාෂ වර්ධනය කිරීම ඉලක්ක කරගෙන ජාතීන් අතර කෙරෙන්නාවූ දේශපාලනය ලෙස ය. | අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයින් අන්තර් රාජ්‍ය සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන වේ. |

* * *

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

විෂය අංකය / பாட இலக்கம்: **23**

විෂයය / பாடம்: **දේශපාලන විද්‍යාව**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 1 | 21. | 1 | 31. | 3 | 41. | 5 |
| 02. | 2 | 12. | 4 | 22. | 3 | 32. | 2 | 42. | 1 |
| 03. | 5 | 13. | 5 | 23. | 5 | 33. | 4 | 43. | 3 |
| 04. | 4 | 14. | 1 | 24. | 2 | 34. | 2 | 44. | 3 |
| 05. | 1 | 15. | 4 | 25. | 2 | 35. | 1 | 45. | 4 |
| 06. | 1 | 16. | 5 | 26. | 5 | 36. | 4 | 46. | 5 |
| 07. | 2 | 17. | 5 | 27. | 3 | 37. | 3 | 47. | 3 |
| 08. | 3 | 18. | 2 | 28. | 2 | 38. | 5 | 48. | 3 |
| 09. | 1 | 19. | 3 | 29. | 2 | 39. | 4 | 49. | 5 |
| 10. | 2 | 20. | 3 | 30. | 1 | 40. | 5 | 50. | 2 |

**එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்**

**අවසාන ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100**

## A කොටස කෙටි පිළිතුරු

❖ **මෙම පිළිතුරු නිශ්චිත ඒවා ලෙස සැලකිය යුතු අතර, ලකුණු ලබා දීමේ දී වෙනත් කිසිදු පිළිතුරක් සැලකිල්ලට නොගත යුතුය.**

1. 1. රාජ්‍යය
   2. ආණ්ඩුව

2. 1. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය
   2. සුභසාධක රාජ්‍යය

3. 1. ජනමතවිචාරණය
   2. ප්‍රාරම්භනය

4. 1. සමාජය
   2. ජාතිය

5. 1. බලතල බෙදීම
   2. නීතියේ ආධිපත්‍යය

6. 1. සමාජවාදී යුගය
   2. කොමියුනිස්ට් සමාජය

7. 1. තෝමස් හොබ්ස්
   2. ජෝන් ලොක්

8. 1. බලපෑම් කණ්ඩායම්/ආශා කණ්ඩායම්
   2. මහජන මතය

9. 1. සන්ධීය රාජ්‍යය ක්‍රමය
   2. ඒකීය රාජ්‍යය ක්‍රමය

10. 1. සර්වජන ඡන්ද බලය
    2. කාලීනව පවත්වන මැතිවරණ

11. 1. 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය
    2. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

12. 1. 1910 කෲව්-මැකලම් ප්‍රතිසංස්කරණය
    2. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

13. 1. 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය
    2. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

14. 1. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය
    2. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

15. 1. ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය
    2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින්

16. 1. 13 වන ව්‍යවස්ථා සංශෝධනය 1987
    2. මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා

17. 1. මහා මණ්ඩලය
    2. ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත මහා මණ්ඩලය විසින්

18. 1. කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියාතික රාජ්‍යය සංවිධානය/සාක්
    2. ද්විපාර්ශ්වික කරුණු සහ දේශපාලන කරුණු

19. 1. අන්තර්ජාතික රතුකුරුස කමිටුව
    2. ජිනීවා-ස්විට්සර්ලන්තය

20. 1. යුරෝපා සංවිධානය/යුරෝපා ආර්ථික හවුල
    2. මහා බ්‍රිතාන්‍ය

## B කොටස

(1). **රාජ්‍යය සමාජය තුළ උත්තරීතර සංවිධානය ලෙස සළකන්නේ ඇයි? (ලකුණු 20)**

- අභිමථාර්තය : **මනුෂ්‍ය සමාජයක් තුළ මනුෂ්‍යයන් විසින් සංවිධානය කර ඇති සමාජ සංවිධාන වල ස්වරූපය හඳුනා ගැනීම සහ එම සංවිධාන අතුරින් රාජ්‍යය උත්තරීතර සමාජ සංවිධානය ලෙස සළකන්නේ ඇයිද යන කරුණ සම්බන්ධයෙන් අපේක්ෂයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම.**

**පිළිතුරෙහි අන්තර්ගත වියයුතු මූලික කරුණු**

- **රාජ්‍යය හඳුනා ගැනීම** **ලකුණු 05**
- **රාජ්‍යය උත්තරීතර සමාජ සංවිධානය ලෙස හඳුනා ගැනීම** **ලකුණු 10**
- **නිගමනය : ප්‍රශ්නය මගින් මතුකර ඇති කරුණ සත්‍යයද නැද්ද යන්න** **ලකුණු 05**

**ආදර්ශ පිළිතුර**

- නිශ්චිත දේශසීමා සහිත භූමි ප්‍රදේශයක් තුළ ජීවත් වන ජනතාවගේ පොදු ආශාවන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගෙන බලාධිකාරී බලය ක්‍රියාවට නැංවීම පිණිස විශේෂිත ආකාරයෙන් සංවිධානය කරන ලද දේශපාලන ආයතන පද්ධතියකින් සමන්විත මනුෂ්‍ය සමාජය රාජ්‍යය ලෙස සළකනු ලැබේ.
- මේ අනුව දේශපාලන වශයෙන් සංවිධානය වූ මනුෂ්‍ය ප්‍රජාවක් රාජ්‍යය ලෙස හඳුනා ගැනීම සඳහා උපකාර වන සාධක කිහිපයක් තිබේ. නිශ්චිත දේශසීමා සහිත භූමි ප්‍රදේශයක් තිබීම, එම භූමිය තුළ ස්ථිර ලෙස පදිංචි වූ මනුෂ්‍ය ප්‍රජාවක් සිටීම, එම මනුෂ්‍ය ප්‍රජාවේ දේශපාලන, ආර්ථික හා සමාජ අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වන පාලන ආයතන පද්ධතියක් තිබීම සහ එසේ ක්‍රියාත්මක වීම සඳහා පදනම සපයන බලාධිකාරී බලයක් තිබීම එම සාධක වේ.
- සමාජය ලෙස සංවිධානය වී ඇති මනුෂ්‍ය ප්‍රජාවක් ගත්විට ඒ තුළ මනුෂ්‍යයන් විසින් විවිධ අරමුණු උදෙසා පිහිටුවා ගෙන තිබෙන සමාජ සංවිධාන දහස් ගණනක් දැකිය හැක. මෙම සංවිධාන අතුරින් කුඩාම සමාජ සංවිධානය වන්නේ පිරිමියෙකු සහ ගැහැණියක එක්ව පිහිටුවා ගන්නා පවුලය. ඉහලම සමාජ සංවිධානය වන්නේ මනුෂ්‍ය ප්‍රජාවේ සියළුම දෙනා විසින් එකට එක් වී පිහිටුවා ගෙන ඇති රාජ්‍යය නැමැති සංවිධානයයි.
- මේ අනුව බලන විට රාජ්‍යයද මිනිසුන් විසින් පිහිටුවා ගෙන ඇති සමාජ සංවිධාන අතුරින් එක් සමාජ සංවිධානයක් වේ. නමුත් අනෙක් සමාජ සංවිධාන සමග සසඳන විට රාජ්‍යය ඒ සෑම සමාජ සංවිධානයකටම වඩා උත්තරීතර සමාජ සංවිධානය ලෙස සළකනු ලැබේ. මේ සම්බන්ධයෙන් බලපාන හේතු සාධක දෙකක් පෙන්වා දියහැක.
- එයින් එකක් වන්නේ මනුෂ්‍ය සමාජයක ජීවත් වන සියළුම මනුෂ්‍යයන්ගේ සහභාගිත්වයෙන් පිහිටුවා ගත් එකම සමාජ සංවිධානය රාජ්‍යය වීමය. වෙනත් කිසිදු සමාජ සංවිධානයකට එවැනි පොදු මනුෂ්‍ය සහභාගිත්ව පදනමක් නොමැත. ඒ සෑම සමාජ සංවිධානයක්ම සංවිධානය කර තිබෙන්නේ මනුෂ්‍ය සමාජයේ කොටසකගේ සහභාගිත්වයෙන් පමණි.
- රාජ්‍යය සතුවන බලාධිකාරී බලය දෙවන හේතු සාධකය වේ. බලාධිකාරී බලය යනුවෙන් හඳුන්වන්නේ බලය යොදවා බලය ක්‍රියාවට නැංවීමට ඇති හැකියාවය. මෙම බලය දේශපාලන විද්‍යාව තුළ සාම්ප්‍රදායිකව හඳුන්වන්නේ ස්වාධිපත්‍ය බලය ලෙසය. එය සළකනු ලබන්නේ උත්තරීතර සහ අසහාය බලයක් ලෙසය.

- අනෙක් සෑම කරුණකටම වඩා රාජ්‍යය අනෙක් සමාජ සංවිධාන වලින් වෙනස් වන්නේත් සහ අනෙක් සමාජ සංවිධාන වලට වඩා රාජ්‍යය උත්තරීතරයැයි සළකනු ලබන්නේත් රාජ්‍යය සතු මෙම බලාධිකාරී බලය හේතුවෙනි.
- රාජ්‍යය විසින් රාජ්‍යය තුළ ජීවත් වන මානව ප්‍රජාව පාලනය කිරීම සඳහා නීති පනවන්නේත්, නීති ක්‍රියාවට නංවන්නේත් සහ නීති කඩකළ විට දඬුවම් පමුණුවන්නේත් මෙම බලය පදනම් කර ගෙනය. මෙසේ පමුණුවන දඬුවම් සරල අවවාද කිරීමේ සිට මරණ දඬුවම දක්වා වෙනස් වියහැක. මෙයින් එක් දෙයක් පැහැදිලි වේ. එනම් දඬුවම් කිරීම හරහා කෙනෙකුගේ ජීවිතය වුවද නැතිකර දැමීමේ නීත්‍යානුකූල බලයක් රාජ්‍යයට හිමිවන බවය.
- මෙයාකාර බලාධිකාරී බලයක් අනෙක් කිසිදු සමාජ සංවිධානයකට හිමිනොවේ. අනෙක් සමාජ සංවිධාන සතුව සාමාජිකයින් කෙරෙහි යෙදවිය හැකි යම් බලයක් තිබුනද එය රාජ්‍යය සතු බලාධිකාරී බලයට කිසිසේත්ම සම නොවේ. අනෙක් අතට එම බලය පවතින්නේ රාජ්‍යයේ බලාධිකාරී බලයට යටත්වය. අනෙක් සමාජ සංවිධාන සතු බලය රාජ්‍යයේ බලාධිකාරී බලය සමග ගැටීමක් ඇතිවුව හොත් එහිදී අනිවාර්යයෙන්ම සිදු වන්නේ සමාජ සංවිධානයේ බලය යටපත් වී රාජ්‍යයේ බලාධිකාරී බලය ක්‍රියාත්මක වීමය. සමහරවිට එම ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස සමාජ සංවිධානය මුලමණින්ම විනාශ වී යාමය.
- මීට ඉහතින්ද දැක්වූ පරිදි රාජ්‍යය අනෙක් සමාජ සංවිධාන වලට වඩා උත්තරීතර වීම කෙරෙහි බලපාන අනෙක් වැදගත් කරුණ වන්නේ පොදුභාවය සහ පෞද්ගලිකභාවය යන කරුණය. මෙයින් අදහස් කරන්නේ රාජ්‍යය පොදු සමාජ සංවිධානයක් වන බව සහ අනෙක් සෑම සමාජ සංවිධානයක්ම පෞද්ගලික සංවිධාන වන බවය.
- මනුෂ්‍ය සමාජයක ජීවත් වන සියළුම මනුෂ්‍යයන්ගේ සහභාගිත්වයෙන් පිහිටුවා ගෙන ඇති එකම සමාජ සංවිධානය වන්නේ රාජ්‍යයි. අනෙක් සෑම සමාජ සංවිධානයක්ම පිහිටුවා ගෙන තිබෙන්නේ මනුෂ්‍ය සමාජයක ජීවත් වන මනුෂ්‍යයන්ගෙන් කොටසකගේ සහභාගිත්වයෙන් පමණි. මේ අනුව රාජ්‍ය ක්‍රියාත්මක වන්නේ රාජ්‍යය තුළ ජීවත් වන සමස්ථ මනුෂ්‍ය ප්‍රජාවම සඳහාය. රාජ්‍යය ක්‍රියාත්මක වන්නේ සමස්ථ මනුෂ්‍ය ප්‍රජාවේ බලය පදනම් කර ගෙනය. එමෙන්ම රාජ්‍යය ස්ථාවර මෙන්ම අඛණ්ඩව පවතින සමාජ සංවිධානයක් වේ. මේ කිසිදු ගුණාංගයක් අනෙක් කිසිදු සමාජ සංවිධානයකට නොමැත. මේ හේතු සාධක නිසාවෙන්ද රාජ්‍යය අනෙක් සමාජ සංවිධාන වලට වඩා උත්තරීතර වේ.
- අන්තර්ජාතික දේශපාලනය කෙරෙහි අවධානය යොමුකරන විටද රාජ්‍යයේ උත්තරීතරභාවය දැකගත හැක. අන්තර්ජාතික දේශපාලනය හා සම්බන්ධ ක්‍රියාකාරිකයින් කිහිප දෙනෙක් දැකිය හැකි වුවද රාජ්‍යයන් හැරුන විට අනෙක් සෑම ක්‍රියාකාරිකයෙක්ම හඳුන්වන්නේ පෞද්ගලික ක්‍රියාකාරිකයින් ලෙසය. අන්තර්ජාතික සමාජයේ පැවැත්ම හෝ විනාශය සම්බන්ධයෙන් බලපාන තීරණාත්මක ක්‍රියාකාරිකයා වන්නේ රාජ්‍යයන්ය. එමනිසයි අන්තර්ජාතික දේශපාලනය රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ දේශපාලනය ලෙස හඳුන්වන්නේ.

2. **පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න**

**(I). ආණ්ඩුවේ ස්වභාවය**
**(11). ආණ්ඩුවේ කාර්යයන්**
**(111) ආණ්ඩුක්‍රම වර්ගීකරණය**

(i). **ආණ්ඩුවේ ස්වභාවය**

- **අභිමතාර්තය**
  ආණ්ඩුව වූ කලී මිනිසුන් විසින් පිහිටුවා ගෙන තිබෙන තවත් සුවිශේෂී දේශපාලන සංවිධානයක් වේ. අනෙක් සමාජ සංවිධාන සමග සළකා බැලීමේදී ආණ්ඩුව නමැති සංවිධානය සළකනු ලබන්නේද අසමසම සංවිධානයක් ලෙසය. එයට හේතුව රාජ්‍යය සතු පරමාධිකාරී බලය ක්‍රියාවට නැංවීමේ බලය ලත් එකම සංවිධානය ආණ්ඩුව වීමය. එබැවින් අනෙක් සෑම සමාජ සංවිධානයක්ම ආණ්ඩුවට යටත් වන අතර ඒවා ක්‍රියාත්මක වි යුත්තේ ආණ්ඩුවේ අණට සහ මෙහෙයවීමට යටත්වය. ආණ්ඩුව සතු මෙම සුවිශේෂී තත්ත්වය පිලිබඳව අපේක්ෂයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම මෙම ප්‍රශ්නයේ අභිමථාර්තය වේ.

- **පිළිතුරෙහි අන්තර්ගත වියයුතු මූළික කරුණු**

| | |
|---|---|
| (අ). ආණ්ඩුව හඳුනා ගැනීම | ලකුණු 04 |
| (ආ). ආණ්ඩුව සුවිශේෂී සංවිධානයක් වන්නේ ඇයි? | ලකුණු 04 |
| (ඇ). නිගමණය | ලකුණු 02 |

**ආදර්ශ පිළිතුර**

- රාජ්‍යයේ කැමැත්ත ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍යයක් තුළ ජීවත් වන ජනතාව විසින් පිහිටුවා ගෙන ඇති දේශපාලන සංවිධානය ආණ්ඩුව ලෙස හැඳින්විය හැක.
- මේ අනුව රජ්‍යයක පැවැත්ම සඳහා අත්‍යවශයෙන්ම තිබිය එක් සංයුතික සාධකයක් ලෙස ආණ්ඩුව සැළකේ. එසේවූවද රාජ්‍යය සමග සැසඳීමේදී ආණ්ඩුව කුඩා සංවිධානයක් වේ. එමෙන්ම න්‍යායාත්මකව සළකා බලන විට රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ ජීවත් වන සියලුම මිනිසුන් ආණ්ඩුවේ සමාජිකයින් නොවනවාක් මෙන්ම රාජ්‍යයේ පැවැත්ම සඳහා අවශ්‍යයැයි සළකන නිශ්චිත භූමි ප්‍රදේශයක් තිබීම යන කරුණද ආණ්ඩුව සම්බන්ධයෙන් එතරම් අදාළ නොවේ. හේතුව රාජ්‍යයට අයත් දේශසීමා වලින් බැහැරව වූවද එම රාජ්‍යය නුවෙන් ආණ්ඩුවට සමහර අවස්ථා වලදී ක්‍රියාත්මක වීමට හැකි වීමය.
- රාජ්‍යයක ස්වභාවය කුමක්ද යන්න තීරණය වන්නේ ආණ්ඩුවේ ස්වභාවය අනුවය. ඒ කෙරෙහි බලපාන්නේ ආණ්ඩුව විසින් අනුගමනය කරන දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනයයි. එම දර්ශනය තීරණය වීම සම්බන්ධයෙන් වැදගත් වන කරුණු හතරක් තිබේ. එම කරුණු හතර වන්නේ, (1). රාජ්‍යයේ බල අධිකාරිය රඳ පවතින්නේ කවුරුන් අතද යන්න, (2). එම බල අධිකාරිය කොපමණ ප්‍රමාණයකින් භාවිතයට ගන්නවාද යන්න, (3). කුමණ ආකාර බල ආයතන ඒ සඳහා යොදා ගන්නවාද යන්න සහ (4). කුමණ ආකාර නීතිරීති සහ ක්‍රියාමාර්ග ඒ සඳහා යොදා ගන්නවාද යන්නය. මෙම කරුණු හතරේ ඒකාබද්ධ ප්‍රතිඵලය ලෙසයි ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන රාජ්‍ය ප්‍රතිපත්ති වල ස්වභාවය තීරණය වන්නේ.
- ආණ්ඩුව පිළිබඳව පොදු අර්තකථනයක් දැකිය නොහැක. සමහරුන් ප්‍රකාශ කරන ආකාරයට ආණ්ඩුව යනු මිනිස් සමාජයක් තුළ මිනිසුන්ගේ පැවැත්ම හා සම්බන්ධ කාර්යයන් බලධාරී පදනමක් මත ක්‍රියාවට නංවන ආතනය ආණ්ඩුව වේ. තවත් සමහරුන් ආණ්ඩුව හඳුන්වා දී ඇත්තේ මිනිස් සමාජය පාලනය කරන හා පරිපාලනය කරන ආයතනය ලෙසය. තවත් අය ආණ්ඩුව අර්ථකතනය කර තිබෙන්නේ මිනිස් සමාජය පාලනය කරන පුද්ගල කණ්ඩායම ලෙසය. රාජ්‍යය පාලනය ක්‍රියාවට නංවන විධික්‍රමය ආණ්ඩුව ලෙසද අර්ථකතනය කර ඇත.

- මේ සෑම අර්ථයකින්ම ප්‍රකාශ වන්නේ එකම අදහසක්ය. එනම් දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජය පාලනය කරන දේශපාලන යාන්ත්‍රණය ආණ්ඩුව ලෙස සැලකෙන බවය.
- ආණ්ඩුව මිනිසුන් විසින් පිහිටුවා ගෙන ඇති සමාජ සංවිධාන අතුරින් එකක් වුවද එය අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය සුවිශේෂී සමාජ සංවිධානයක් ලෙස සළකනු ලැබේ. ඒ කෙරෙහි බලපාන හේතු සාධක කිහිපයක් පෙන්වා දියහැක.
    1. සාමාජිකයින් වුවද නොවූවද රාජ්‍යය තුළ ජීවත් වන සියළුම පුරවැසියන් කෙරෙහි බලාධිකාරී බලය යෙදවිය හැකි එකම සංවිධානය වීම.
    2. බලාධිකාරී බලය පදනම් කරගෙන ඒකීය නීති පැනවීමේ හැකියාව ඇති එකම සංවිධානය වීම.
    3. පුරවැසියන්ගේ ජීවිතය හා මරණය සම්බන්ධයෙන් අවසාන තීරණ ගැනීමේ නීත්‍යානුකූල ඒකාධිකාරී බලය හිමි එකම සංවිධානය වීම.
    4. පරමාධිකාරී බලය යෙදවිය හැකි එකම සමාජ සංවිධානය ආණ්ඩුව වීම.

**නිගමණය** = ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන්නේ ආණ්ඩුව වූ කළී මිනිසුන් විසින් පිහිටුවා ගෙන තිබෙන සමාජ සංවිධාන අතුරින් එකක් වන බවය. එසේවුවද එය දේශපාලන සංවිධානයක් වන අතර රාජ්‍ය වෙනුවෙන් රාජ්‍යයේ පරමාධිකාරී බලය ක්‍රියාවට නංවන එකම ආතනය වේ. එබැවින් ආණ්ඩුව අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය සුවිශේෂී සමාජ සංවිධානයක් බවට පත් වේ. ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන අනෙක් කරුණ වන්නේ රාජ්‍යයේ ස්වභාවය තීරණය වන්නේ ආණ්ඩුවේ ස්වභාවය මත බවය. ආණ්ඩුවේ ස්වභාවය තීරණය වන්නේ එය අනුගමනය කරන දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනය සහ එය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැණෙන ආණ්ඩුක්‍රම යාන්ත්‍රණයේ ස්වරූපය අනුව බවය.

(ii). **ආණ්ඩුවේ කාර්යයන්**

- **අභිමථාර්ථය**

  මිනිසුන් විසින් රාජ්‍යය සංවිධානය කරනු ලැබූයේ ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගතකිරීමට බව ඇරිස්ටෝටල් ප්‍රකාශ කළේය. රාජ්‍යය තුළ මෙම කාර්යභාරය පැවරී ඇත්තේ ආණ්ඩුවටය. මේ අනුව ආණ්ඩුව විසින් කළයුතු කාර්යභාරය අතිශයින්ම පුළුල් වේ. මෙම ප්‍රශ්නයේ අභිමථාර්ථය වන්නේ රාජ්‍යය තුළ ජීවත් වන ජනතාවට ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගතකිරීම සඳහා ආණ්ඩුව විසින් කුමක් කළ යුතුද යන්න පිළිබඳව අපේක්ෂයින්ගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමය.
- **පිළිතුරෙහි අන්තර්ගත වියයුතු මූලික කරුණු**

| | |
|---|---|
| **(අ). ආණ්ඩුවේ කාර්යයන් හඳුනා ගැනීම** | **ලකුණු 06** |
| **(ආ). කාර්යයන් ක්‍රියාවට නංවන ආකාරය** | **ලකුණු 02** |
| **(ඇ). නිගමණය** | **ලකුණු 02** |

**ආදර්ශ පිළිතුර**

- ආණ්ඩුව වූ කළී රාජ්‍යයේ අපේක්ෂාවන් ක්‍රියාවට නංවන එහි ප්‍රායෝගික අංශය ලෙස සැළකේ. ඒ අනුව රාජ්‍යය බිහිකර ගැනීමෙන් මිනිසුන් බලාපොරොත්තු වූ කාර්යයන් ඉටු කිරීම ආණ්ඩුවේ වගකීම වේ.
- ආණ්ඩුවේ කාර්යයන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.
    1. අභ්‍යන්තර කාර්යයන් සහ
    2. බාහිර කාර්යයන් වශයෙනි.
- **අභ්‍යන්තර කාර්යයන්**

(අ). **සමාජ ස්ථාවරභාවය ආරක්ෂා කොට පවත්වා ගෙනයාම**

මෙයින් අදහස් කරන්නේ රට තුළ නීතිය හා සාමය පවත්වා ගෙන යාමය. මේ සඳහා ආණ්ඩුව ක්‍රියා කරන්නේ හමුදාව, පොලීසිය, අධිකරණය, බන්ධනාගාර සහ රාජ්‍යය සේවාව යන උපකරණ ප්‍රයෝජනයට ගනිමිනි.

**(ආ). ආර්ථිකය කළමණාකරනය කිරීම**

ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළබඳව සුපරීක්ෂාකාරී වීම, ආර්ථික වෘද්ධිය වේගවත් කිරීම සඳහා ක්‍රියාකිරීම, ආර්ථික ප්‍රවනතාවන් ස්ථාවර කිරීම, ආර්ථිකයේ වැදගත් අංශ පාලනය කිරීම, යටිතල පහසුකම් සැපයීම, ආයාත-නිර්යාත පාලනය, රාජ්‍යය ව්‍යවසාය සංවිධානය කිරීම සහ කළමණාකරනය කිරීම යනාදී කාර්යයන් මෙයට අයත් වේ.

**(ඇ). සමාජ සුභසාධන කාර්යයන්**

ආණ්ඩුවක් සතු තවත් මූලික කාර්යයක් ලෙස සමාජ සුභසාධනය හැඳින්විය හැකි ය. නිර්බාධවාදී ප්‍රතිපත්තිය බිඳ වැටී සමාජ සුභසාධනවාදය වර්ධනය වීමත් සමග සමාජ සුභසාධනය රජයේ වගකීමක් බවට පත්විය. වියපත් පුද්ගලයින්, අබල-දුබලතා සහිත පුද්ගලයින්, සේවා වියුක්තිකයින්, අසරණයින් වැනි සමාජ අවවරප්‍රසාදිත ජන කොටස් වලට ආධාර කිරීම. සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රම පවත්වා ගෙනයාම, නිවාස පහසුකම් සැළසීම, සමාජ රක්‍ෂණය, රැකියා අවස්ථා සැළසීම සහ විශේෂ සමාජ කොටස් එනම් යුද්ධ ආබාධිතයින් හා සරණාගතයින් වැනි අයට ආධාර කිරීම, මත්ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම වැනි කාර්යයන් මෙයට අයත් වේ.

**(ඈ). අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

පුරවැසියන් සතු සිවිල් දේශපාලන හා සමාජීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම ආණ්ඩුවට පැවරේ. එමෙන් ම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම මෙන් ම අයිතිවාසිකම් භුක්ති විඳිය හැකි සාමකාමී පරිසරයක් ගොඩනැගීම ද ආණ්ඩුවේ වගකීමකි.

**(ඉ). සමාජ කළමණාකරනය**

ගැටුම් කළමණාකරනය කිරීම සහ ගැටුම් විසඳීම, කම්කරු ආරවුල් සමථනය කිරීම, හදිසි ආපදා සහන සැළසීම වැනි කාර්යයන් මෙයට අයත් වේ.

**(ඊ). පරිසර කළමණාකරනය**

ස්වාභාවික සම්පත් ආරක්‍ෂා කිරීම, ජාතික උද්‍යාන සහ රාජ්‍යය ඉඩම් කළමණාකරනය, පරිසර දූෂනය වැලක්වීම, සෞඛ්‍යයට අහිතකර අපද්‍රව්‍ය බැහැර කිරීම කළමණාකරනය කිරීම යනාදී කාර්යයන් මෙයට අයත් වේ.

**(උ). අධ්‍යාපන සහ සංස්කෘතික කාර්යයන්**

අධ්‍යාපනය පවත්වා ගෙනයාම, ජාතික සංඛේත පවත්වා ගෙනයාම සහ සංස්කෘතික කාර්යයන් යනාදිය මෙයට අයත් වේ.

**ආණ්ඩුවේ බාහිර කාර්යයන්**

විදේශ ප්‍රතිපත්තිය කළමණාකරනය කිරීම ආණ්ඩුවක ප්‍රධානම බාහිර කාර්යය ලෙස සැළකේ. විදේශ ප්‍රතිපත්තියේ මූලික අරමුණ වන්නේ ජාතික අභිලාෂ ආරක්‍ෂා කොට පවත්වා ගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීමය. ප්‍රධාන ජාතික අභිලාෂ පහත සඳහන් පරිදි වේ.

1. **ජාතික ආරක්‍ෂාව තහවුරු කොට පවත්වා ගෙනයාම**

   මෙයින් අදහස් කරන්නේ ජාතික නිදහස, දේශසීමා ඒකාග්‍රතාව සහ භූමියේ අඛණ්ඩ පැවැත්ම ආරක්‍ෂා කොට පවත්වා ගෙන යාමය.

2. **ජාතික ආර්ථිකය ආරක්‍ෂා කිරීම සහ වර්ධනය කිරීම**

   අන්තර්ජාතික වෙළඳාම, අන්තර්ජාතික ආයෝජන ලබා ගැනීම හා කළමණාකරනය කිරීම, ණය හා වෙනත් අධාර ලබා ගැනීම යනාදිය මෙයට අයත් වේ.

3. **ජාතික මතවාදය ආරක්ෂා කොට පවත්වා ගෙනයාම**

මෙයින් අදහස් කරන්නේ රාජ්‍යය විශ්වාස කරන ආර්ථික හා දේශපාලන දර්ශනය ආරක්ෂා කොට පවත්වා ගෙන යාමය.

4. **ජාතික අභිමානය ආරක්ෂා කොට පවත්වා ගෙනයාම**

රටේ නම්බුව සහ අභිමානය අන්තර්ජාතික වශයෙන් ආරක්ෂා කොට පවත්වා ගෙනයාම මෙයින් අදහස් වේ.

**නිගමනය**

ඉහතින් දැක්වූයේ ආණ්ඩුවක් විසින් ඉටුකරන කාර්යයන්ගේ දළ සටහනක්ය. ඒ දෙස බැලීමේදී පෙනී යන්නේ ආණ්ඩුවක් විසින් කරන කාර්යයන් පිළිබඳව නිශ්චිත සීමාවක් දැක්විය නොහැකි බවය. ආණ්ඩුවේ කාර්යයන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී පෙනීයන මූලික ලක්ෂණ දෙකක් තිබේ. එයින් එකක් වන්නේ ආණ්ඩුව විසින් කරන කාර්යයන් රටෙන් රටට වෙනස් වීමය. අනෙක් ලක්ෂණය වන්නේ එම කාර්යයන් කාලයෙන් කාලයට වෙනස් වීමය. අවසාන වශයෙන් කිවහැක්කේ ආණ්ඩුව අනුගමනය කරන දේශපාලන හා ආර්ථික දර්ශනය අනුවද ආණ්ඩුවේ කාර්යයන්හි ස්වභාවය වෙනස් වන බවය.

(iii). **ආණ්ඩුක්‍රම වර්ගීකරණය**

- **අභිමථාර්ථය**

ආණ්ඩු සම්බන්ධයෙන් වර්තමානයේ මෙන්ම අතීතය තුළද දැකිය හැකි ලක්ෂණය වන්නේ විවිධ ආණ්ඩුක්‍රම ලෝක රාජ්‍ය පද්ධතිය තුළ පවතින ආකාරයයි. ආණ්ඩු සම්බන්ධයෙන් මී ලඟට දැකිය හැකි ලක්ෂණය වන්නේ එම ආණ්ඩු විවිධ නිර්ණායක යොදා ගනිමින් වර්ග කර තිබෙන ආකාරයයි. මෙසේ වර්ග කිරීම දේශපාලන විද්‍යාව විෂය අධ්‍යයන විෂයයක් වශයෙන් අධ්‍යයනය කිරීම ආරම්භ වූ දිනයේ සිටම දැකිය හැකි දෙයක් වේ. මෙම ප්‍රශ්නයේ අභිමථාර්ථය වන්නේ ඉහත දැක්වූ පරිදි ආණ්ඩුක්‍රම වර්ග කර ඇති ආකාරය සහ එසේ වර්ග කිරීම සඳහා භාවිතයට ගෙන තිබෙන නිර්ණායකයන් පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.


**පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු**

| | |
|---|---|
| **(අ). ආණ්ඩුක්‍රම වර්ගීකරණයේ ඓතිහාසික පදනම** | **ලකුණු** 02 |
| **(ආ). නූතනයේ ආණ්ඩුක්‍රම වර්ග කරන ආකාරය** | **ලකුණු** 06 |
| **(ඇ). නිගමණය** | **ලකුණු** 02 |

**ආදර්ශ පිළිතුර**

- ආණ්ඩුක්‍රම වර්ග කිරීම දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම ආරම්භ වූ ග්‍රීක යුගයේ සිටම පැවත එන දෙයක් ලෙස ප්‍රකාශ කළහැක. ලොව ප්‍රථම වරට ආණ්ඩුක්‍රම වර්ගීකරණයක් ඉදිරිපත් කළේ ග්‍රීක යුගයේ ජීවත් වූ දේශපාලන දාර්ශනිකයෙක් වන ප්ලේටෝ විසිනි. ඔහු සමකාලීනව පැවති ආණ්ඩුක්‍රම 1. පරමාදර්ශී ආණ්ඩු, 2. රාජාණ්ඩු, 3. කෲර ආඥාදායක ආණ්ඩු, 4. රදළ ආණ්ඩු, 5. කතිපයාධිකාරී ආණ්ඩු, 6. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු සහ 7. දූෂිත ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු වශයෙන් කොටස් හතකට වර්ග කරනු ලැබීය.
- මෙම ආණ්ඩුක්‍රම අතුරින් මුල් ආණ්ඩුක්‍රම හතර හොඳ ආණ්ඩු ලෙසද අවසාන තුන නරක ආණ්ඩු ලෙසද යළිත් වරක් එම ආණ්ඩුක්‍රම හත ප්ලේටෝ විසින් කොටස් දෙකකට වර්ග කරන ලදි.
- ඉන්පසුව ඇරිස්ටෝටල් විසින් (අ).ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නැංවීමට සම්බන්ධ වන පුද්ගල සංඛ්‍යාව සහ (ආ).ආණ්ඩුක්‍රමයේ ස්වභාවය යන නිර්ණායක දෙක පනදම් කරගෙන ආණ්ඩුක්‍රම කොටස් හයකට වර්ග කරනව 1. රාජාණ්ඩු, 2. කෲර ආඥාදායක ආණ්ඩු, 3. රදළ ආණ්ඩු, 4. කතිපයාධිකාරී ආණ්ඩු 5. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු සහ 6. දූෂිත ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු වශයෙන්.
- අනතුරුව එන රෝම සහ මධ්‍යතන යුගයන්හිදී ද දේශපාලන චින්තකයින් විසින් ආණ්ඩුක්‍රම වර්ග කරන ආකාරය දැකිය හැක. මේ සඳහා ඔවුන් අඩුවැඩි වශයෙන් භාවිතයට ගත්තේ ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ආණ්ඩුක්‍රම වර්ගීකරණය සඳහා යොදාගත් නිර්ණායකයන්ය. මේ කාල පරිච්ඡේදය තුළදී ආණ්ඩුක්‍රම ප්‍රධාන වශයෙන්ම වර්ගීකරනය කළේ රාජාණ්ඩු, රදල ආණ්ඩු හා සමූහාණ්ඩු ක්‍රම වශයෙනි.

- නව යුගය තුළ මොන්ටෙස්ක්‍යු විසින් ආණ්ඩුක්‍රම සමූහාණ්ඩු, රාජාණ්ඩු සහ ආඥාදායක වශයෙන් කොටස් තුනකට වර්ග කරන අතර රූසෝ විසින් රාජාණ්ඩු, රදල ආණ්ඩු සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු වශයෙන් ආණ්ඩුක්‍රම වර්ග කරන ආකාරය දැකිය හැකි වේ. බ්ලන්ට්ෂ්ලි විසින් රූසෝගේ වර්ගීකරණයට නව ආණ්ඩුක්‍රමයක් එක් කරනව දේවධර්මවාදී ආණ්ඩු නමින්.
- මෑත කාලය තුළ ආණ්ඩුක්‍රම වර්ගීකරණය කළ දේශපාලන විද්‍යාඥයින් අතුරින් වැදගත් අයෙකු ලෙස ජේ. ඒ. ආර්. මැරියට් හඳුන්වා දිය හැක. ඔහු විසින් ආණ්ඩුක්‍රම කොටස් කිහිපයකට වර්ග කරනව සන්ධීය සහ ඒකීය (බලය මධ්‍යගතවීම හා විමධ්‍යගත වීම අනුව), නම්‍ය සහ අනම්‍ය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාරය අනුව) සහ පාර්ලිමේන්තු සහ ජනාධිපති (විධායක හා ව්‍යවස්ථාදායක සම්බන්ධතා අනුව) වශයෙන් ප්‍රධාන කොටස් තුනකට. මෙයට අමතරව ඔහු විසින් තවත් ආණ්ඩුක්‍රමයක් ඉදිරිපත් කරනව ආඥාදායක ආණ්ඩු වශයෙන්. මේ සඳහා පදනම ලෙස යොදා ගත්තේ විධායකය හා ව්‍යවස්ථාදායකය සතු බලතල වල ප්‍රමාණයයි. ව්‍යවස්ථාදායකය ඉක්මවා ගිය අධි බලයක් විධායකය භුක්ති විඳින්නේ නම් එවැනි ආණ්ඩු ඔහු විසින් හඳුන්වනව ආඥාදායක ආණ්ඩු ලෙස.
- මෑත කාලයේ ආණ්ඩුක්‍රම වර්ගීකරණය සම්බන්ධයෙන් වැදගත් සැළැස්මක් ඉදිරිපත් කළ දේශපාලන විද්‍යාඥයෙකු ලෙස ස්ටීවන් ලීකොක් හඳුන්වා දිය හැක. ඔහු ඉදිරිපත් කළ සැළැස්ම පහත සඳහන් පරිදි වේ.



- වර්තමානයේ ආණ්ඩු ක්‍රම වර්ගීකරණය සඳහා යොදා ගැණෙන ප්‍රධාන නිර්ණායක තුනක් හඳුනා ගතහැක. ඒවා වන්නේ;

    1. ආණ්ඩු පිළිගත් දේශපාලන හා ආර්ථික මතවාද අනුව
    2. බලය මධ්‍යගත වීම හා විමධ්‍යගත වීම අනුව
    3. ආණ්ඩුවේ විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව

**1. දේශපාලන දර්ශනය අනුව ආණ්ඩු ක්‍රම වර්ගීකරණ**

- මේ යටතේ පහත දැක්වෙන ආණ්ඩුක්‍රම හඳුනා ගතහැක.
    1. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී
    11. සමාජවාදී
    111. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී

2. බලය මධ්‍යගත වීම හා විමධ්‍යගත වීම අනුව
    1. ඒකීය
    11. සන්ධිය
    111. සහ සන්ධීය

3. විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව
    1. කැබිනට්/පාර්ලිමේන්තු
    11. ජනාධිපති
    111. අර්ධ ජනාධිපති
    1V. ඒකතන්ත්‍ර

- **නිගමණය:** ඉහත දක්වා ඇත්තේ ආණ්ඩුක්‍රම වර්ගීකරනය ඓතිහාසික වශයෙන් පටන් ගෙන අද දක්වා ඉදිරියට ගමන් කර ඇති ආකාරයයි. එම ගමන් මාර්ගය දෙස බලන විට පෙනී යනව කාළයෙන් කාළයට පැවති ආණ්ඩුක්‍රම වෙනස් වී තිබෙන ආකාරය සහ ඒ අනුව වර්ගීකරණ විධික්‍රමද වෙනස් වී තිබෙන ආකාරය.

3. **පහත දැක්වෙන සංකල්ප අතුරෙන් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.**
    (1). නීතියේ ආධිපත්‍යය
    (11). බලතල වෙන් කිරීම
    (111). ව්‍යවස්ථානුකූලවාදය

(1). **නීතියේ ආධිපත්‍යය**

- **අභිමතාර්ථය**

නීතියේ ආධිපත්‍යය දේශපාලන විද්‍යාවේ පැරණිම සංකල්ප අතුරෙන් එකක් වේ. එමගින් අවධාරණය කරන්නේ නීතියේ උත්තරීතරභාවයයි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යාවශයම අංගයක් ලෙස නීතියේ ආධිපත්‍යය සළකනු ලැබේ. නීතියේ ආධිපත්‍යයෙන් තොරව පවතින පාලනය සළකනු ලබන්නේ අනධිකාරී පාලනයක් ලෙසය. නීතියේ ආධිපත්‍යය සංකල්පයේ මූලිකම ගුණාංගය වන්නේ නීතිය සියළු දෙනාටම ඉහලින් සිටින බවත් සහ නීතිය ඉදිරියේ සියළු දෙනාම එකසමාන වන බවත්ය. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ ඉහත දැක්වූ කරුණු සම්බන්ධයෙන් අපේක්ෂයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

- **පිළිතුර තුළ අඩංගු වියයුතු මූලික කරුණු**

**(අ). නීතියේ ආධිපත්‍යය සංකල්පයේ මූලික ස්වභාවය හඳුනා ගැනීම** **ලකුණු 05**
**(ආ). සංකල්පයේ ප්‍රායෝගික භාවිතය** **ලකුණු 03**
**(ඇ). නිගමණය** **ලකුණු 02**

**ආදර්ශ පිළිතුර**

- නීතියේ ආධිපත්‍යය යන සංකල්පය දේශපාලන විද්‍යාව විෂය තුළ පවතින පැරණි සංකල්පයකි. ප්ලේටෝ විසින් සිය සමූහාණ්ඩුව කෘතියෙන් ඉදිරිපත් කළ පරමාදර්ශී රාජ්‍යයේ නීතියේ පාලනයට යටත් නොවන දාර්ශනික පාලකයාගේ පාලනයට එරෙහිව ඇරිස්ටෝටල් විසින් නීතියේ පාලනයේ යෝග්‍යතාව පිළිබඳ අදහස ඉදිරිපත් කරනු ලැබීය. ග්‍රීක අවධියෙන් පසු එළඹෙන රෝම අවධියේ දී සිසරෝ විසින් ද නීතියේ ආධිපත්‍ය පිළිබඳ ව අදහස් ඉදිරිපත් කරනු ලැබීය.
- නීතියේ ආධිපත්‍යය පිළිබඳව නූතන මතය ඉදිරිපත් කරන්නේ 17 වන සියවස ආරම්භයේ දී බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය තුළ රාජාණ්ඩුවාදීන් සහ පාර්ලිමේන්තුවාදීන් අතර පැන නැගුනු බල අරගලය පදනම් කොටගෙන ය. එහි දී පාලකයා රටේ පොදු නීතියට යටත්ව පාලනය මෙහෙය විය යුතු බව පාර්ලිමේන්තුවාදීන්ගේ මතය විය.
- නව යුගය තුළ නීතියේ ආධිපත්‍ය සම්බන්ධයෙන් විධිමත් හා ක්‍රමානුකූල අදහසක් ඉදිරිපත් කලේ බ්‍රිතාන්‍ය ජාතික නීතිවේදියෙකු වූ ඩයිසි විසිනි. ඔහු විසින් 1885 දී ප්‍රකාශයට පත් කෙරුනු Law of the Constitution කෘතිය තුළින් මෙම සංකල්පය ඉදිරිපත් කරනු ලැබීය.
- ඩයිසි නීතියේ ආධිපත්‍යය හා සම්බන්ධ මූලධර්ම තුනක් ඉදිරිපත් කළේ ය.
    - I. රාජ්‍ය පාලනයේ දී සාමාන්‍ය නීතිය උත්තරීතර ලෙස සැලකීම
    - II. නීතිය ඉදිරියේ සියලු දෙනාම එක හා සමානව සැලකීම
    - III. පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කොට පවත්වාගෙන යෑම
- ඩයිසි ඉදිරිපත් කළ නීතියේ ආධිපත්‍ය සංකල්පයේ හරය වන්නේ ආණ්ඩුකරණය නීතියට අනුව පවත්වාගෙන යාමය. මේ අනුව සෑම පුද්ගලයෙකුම(පාලකයා මෙන්ම පාලිතයින් ද) නීතියට යටත් වන අතර ඔවුන් නීතිය ඉදිරියේ එක සමාන වේ. නීතියට ඉහළින් කිසිවෙකුත් නොවන අතර නීතිය ඉදිරියේ කිසිවෙකුටත් විශේෂ වරප්‍රසාද හිමි නොවේ.
- ඩයිසිට අනුව රටක් තුල පැවතිය හැක්කේ එක් නීති ක්‍රමයක් පමණි. මෙමගින් අදහස් කරන්නේ. ව්‍යවස්ථානුකූල නීතිය, ව්‍යවස්ථාදායයකය විසින් පනවන නීති සහ අධිකරණ තීන්දු යන කොටස් තුනේ එකතුවෙන් ගොඩනැගී ඇති පොදු නීතියයි. පුරවැසියන්ට දඬුවම් කළ හැක්කේ පොදු නීතිය කඩකළහොත් පමණි.
- කරන ලද වරද විනිශ්චය කළ යුත්තේ රටේ පවතින සාමාන්‍ය උසාවි මගින් ඒ අවස්ථාවේ පවතින නීතිය පදනම් කොටගෙනය. වරදකරු වුවහොත් නීතියෙන් නියම කරන ලද දඬුවම් පමණක් ලබා දිය යුතුය. එමෙන් ම අපරාධයන් විනිශ්චය කිරීමට අලුතින් නීති පැනවීමට සහ අලුතෙන් උසාවි පිහිටුවීමට ද නොහැකි ය.
- පුරවැසි අයිතිවාසිකම් නීතියෙන් හිමි වූ දේ නොවන අතර නීතියෙන් කළ යුත්තේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම බව ද මෙමගින් අවධාරණය කෙරේ.
- ඩයිසි නීතියේ ආධිපත්‍ය සංකල්පය ඉදිරිපත් කර තිබෙන්නේ සමකාලීන එංගලන්තයේ ක්‍රියාත්මක වූ සාමාන්‍ය නීතිය පදනම් කොටගෙනය. එබැවින් එම සංකල්පයේ දුර්වලතා රැසක් දැකිය හැකි බව විචාරකයින් විසින් පෙන්වා දේ.
- එක් දුර්වලතාවක් වන්නේ තම න්‍යාය ගොඩ නැගීමේදී ඩයිසි විසින් සමකාලීන යුරෝපය තුළ සාමාන්‍ය නීතියට අමතරව ක්‍රියාත්මක වූ අනෙක් නීති සැළකිල්ලට නොගැනීමය. මේ කාළය වනවිට පරිපාලන නීති මෙන්ම පරිපාලන අධිකරණ ද ප්‍රංශය වැනි රටවල ක්‍රියාත්මක වෙමින් තිබුණි. නමුත් මේවායේ ක්‍රියාකාරිත්වය ගැන ඩයිසි අවධානය යොමු නොකළා පමණක් නොව ඔහුගේ විශ්වාසය වූයේ සාමාන්‍ය නීතියට අමතර ව පවතින වෙනත් ඕනෑම නීතියක් මිනිස් අයිතිවාසිකම් සීමාවීම කෙරෙහි බලපාන බවය. මෙම අදහස වැරදි බව විචාරකයින් පෙන්වා දේ.

- නීතිය ඉදිරියේ සියලු දෙනාම එක සමාන වනවාය යන ඩයිසිගේ දෙවන අදහසද වැරදි බව විචාරකයෝ පෙන්වා දෙති. මෙම අදහස ඉදිරිපත් කිරීමේදී ආර්ථික විෂමතාවන් අනුව සමාජය තුළ පවතින පංති විෂමතාවන් ඩයිසි සැළකිල්ලට ගෙන නොමැති බව විචාරකයෝ පෙන්වා දෙති.
- මිනිසුන්ට අයිතිවාසිකම් හිමිවන්නේ උපතින්ම මිස නීතියෙන් නොවන බවට ඩයිසි ඉදිරිපත් කරන තුන්වන අදහසද වැරදි බව ප්‍රකාශ කරන විචාරකයින් අරගල මගින් මිනිස් අයිතිවාසිකම් දිනා ගැනීමේ තත්ත්වයන් ඩයිසි සැළකිල්ලට ගෙන නොමැති බව තවදුරටත් කියා සිටිති.
- ඩයිසි ගේ සංකල්පය පසුකාලීනව දේශපාලන විද්‍යාඥයින් විසින් මෙන්ම නීතිවේදීන් විසින්ද තවදුරටත් සංවර්ධනය කරන ආකාරය දැකිය හැක. අද නීතියේ ආධිපත්‍යය සංකල්පයෙන් කරුණු රාශියක් අර්ථ ගැන්වේ. නීතියට අනුව රාජ්‍ය පාලනය මෙහෙයවීම හෙවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන රාජ්‍ය පාලනය මෙහෙයවීම, නීතිය සියළු දෙනාට එක සමාන වීම හා නීතියේ සමාන ආරක්ෂාව සියළු දෙනාට එක සමානව හිමිවීම, මිනිසුන්ගේ පෞද්ගලික සුරක්ෂිතතාව තහවුරු කිරීම, මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කොට පවත්වා ගෙනයාම, මාධ්‍යය නිදහස ආරක්ෂා කිරීම, ආගමික නිදහස ආරක්ෂා කිරීම, පුරවැසියන්ට අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිතිය තහවුරු කිරීම, නිදහසේ තමන් කැමති දේශපාලන පක්ෂයකට සම්බන්ධ වී දේශපාලනය කිරීමේ අයිතිය තහවුරු කිරීම, නිර්දෝශීභාවයේ පූර්ව නිගමණය යුක්තිය පසිඳලීමේ පදනම ලෙස යොදා ගැනීම සහ නඩු විභාග කිරීම ප්‍රසිද්ධියේ සහ විවෘතව කිරීම, අතීතයට බලපාන ලෙස නීති නොපැනවීම සහ අධිකරණයේ ස්වාධීනත්වය එම කරුණු අතර ප්‍රධාන වේ.

**නිගමනය**

ඉහත දැක්වූ කරුණු සමස්ථයක් ලෙස ගෙන සළකා බැලීමේදී පෙනී යන්නේ නීතියේ ආධිපත්‍යය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරනයේ පදනම වන බවය. වෙනත් ආකාරයකට කියනවා නම් නීතියේ ආධිපත්‍යය පැවතිය හැක්කේ ව්‍යවස්ථානුකුල පාලනයක් තුළ විනා ආඥාදායක පාලන ක්‍රමයක් තුළ නොවන බවය. ආඥාදායක පාලනය හා නීතියේ ආධිපත්‍යය කිසිම විටක එකට ගමන් කරන දේවල් නොවේ. එමනිසයි නීතියේ ආධිපත්‍යය සංකල්පය ආණ්ඩු බලය සංවරණය කිරීමේ ඉතාම හොඳ උපකරණයක් ලෙස සළකනු ලබන්නේ.

**(11). බලතල බෙදීමේ සිද්ධාන්තය**

- **අභිමථාර්තය**

ආණ්ඩු ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දැකිය හැකි සදාතනික සත්‍යයක් වන්නේ ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීම සඳහා සහභාගි වන පාලක පංතිය ඒ සඳහා ඔවුන් ජනතා ඡන්දයෙන් තේරී පත් වූවද නැතිනම් පාරම්පරිකව තේරී පත් වූවද එසේත් නොමැති නම් වෙනත් ආකාරයකින් තේරී පත් වූවද බලයට පත් වූ පසු රාජ්‍ය බලය අයථා ලෙස භාවිතා කිරීමට නිතැතින්ම පෙළඹෙන බවය. මේ තත්ත්වය වළක්වාලමින් ආණ්ඩු බලය නීතියට අනුකූලව ක්‍රියාවට නංවන්නේ කෙසේද? මේ සඳහා ඇති එකම විධික්‍රමය වන්නේ ආණ්ඩුවේ බලය සංවරණය කිරීමය. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති දේශපාලන න්‍යායන් අතුරෙන් එකක් වන්නේ බලතල බෙදීමේ සිද්ධාන්තයයි. මෙම ප්‍රශ්නයේ අභිමථාර්තය වන්නේ බලතල බෙදීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ආණ්ඩුවේ බලය සංවරණය කිරීමේ සංරෝධකයක් ලෙස එය යොදා ගන්නේ කෙසේද සහ එම න්‍යායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව පවතින ගැටළු මොනවාද යන්න පිළිබඳව අපේක්ෂයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

- **පිළිතුරෙහි අඩංගු වියයුතු මූලික කරුණු**
  - **(අ). ආණ්ඩුවේ බලය බෙදා වෙන්කළ යුත්තේ ඇයි** ලකුණු 02
  - **(ආ). බලතල බෙදීමේ න්‍යායේ අන්තර්ගතය** ලකුණු 04
  - **(ඇ). බලතල බෙදීමේ න්‍යායේ වාසි හා අවාසි** ලකුණු 02
  - **(ඈ). නිගමණය** ලකුණු 02

- **ආදර්ශ පිළිතුර**
  - සංවරණය හා පාලනය නොකරන ලද ආණ්ඩු බලය නියත ලෙසම ආඥාදායකත්වයක් බිහිවීම කෙරෙහි බලපානු ලැබේ. එබැවින් ආණ්ඩුව ආඥාදායක වීම වැලැක්වීම සඳහා මෙන්ම ජනතාවගේ නිදහස ආරක්‍ෂා කිරීම සඳහාත් ආණ්ඩුවේ බලය සීමාවන්ට යටත් කළ යුතු බව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම මූලධර්ම මගින් අවධාරණය කෙරේ. මේ සඳහා භාවිතයට ගතහැකි ඉතාම හොඳ උපකරණයක් ලෙස බලතල බෙදීමේ න්‍යාය සැළකේ.
  - ආණ්ඩුවේ බලය විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ වශයෙන් කොටස් කර එකිනෙකට වෙන් වූ ආයතන තුනක් මගින් ක්‍රියාවට නැංවීම දේශපාලන විද්‍යාව තුළ හඳුන්වන්නේ බලතල බෙදීම වශයෙන්ය.
  - බලතල බෙදීමේ න්‍යාය දේශපාලන විද්‍යාවේ හමුවන තවත් පැරණි න්‍යායක් හැටියට හඳුන්වා දියහැක. මේ සම්බන්ධයෙන් දළ අදහසක් ප්‍රථම වරට ඉදිරිපත් කළේ ග්‍රීක යුගයේදී ඇරිස්ටෝටල් විසිනි. ඔහු විසින් ආණ්ඩුවේ කාර්යයන් කරුණු සාකච්ඡා කිරීම, පොදු වැඩ කටයුතු පරිපාලනය කිරීම සහ යුක්තිය පසිඳලීම යනුවෙන් කොටස් තුනකින් සමන්විත වන බවත් එම කාර්යයන් වෙනම ආයතන මගින් ක්‍රියාවට නැංවිය යුතු බවත් ප්‍රකාශ කළේය.
  - රෝම යුගයේ ජීවත් වූ පොලිබියස් සහ සිසරෝ විසින් ද ආණ්ඩුවේ බලතල අතර තුලනයක් පිළිබඳව අදහස් ඉදිරිපත් කළහ. ඒ හැරුණු විට බොඩෑන් විසින් ද විධායක බලය සහ අධිකරන බලය වෙනස් පුද්ගලයන්ගෙන් හෝ ආයතන මගින් ක්‍රියාත්මක කළ යුතු බව පෙන්වා දෙන ලදි. එමෙන්ම ඉංග්‍රීසි ජාතිකයන් වූ ක්‍රොම්වෙල් සහ ජෝන් ලොක් විසින් ද ආණ්ඩුවේ කාර්යයන් බෙදා වෙන් කර ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි.
  - බලතල බෙදීමේ අදහස විධිමත් ලෙස ඉදිරිපත් කරනු ලැබුයේ ප්‍රංශ ජාතික චාල්ස් මොන්ටෙස්ක්‍යු විසිනි. ඔහු විසින් 1748 දී රචිත නීතියේ සාරය (The Spirit of Laws) කෘතිය මගින් මෙම සංකල්පය ඉදිරිපත් කළේය.
  - බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කරමින් මොන්ටෙස්ක්‍යු කියා සිටියේ නිරන්තර අත්දැකීම් මගින් අපට පෙන්වා දෙන එක් සත්‍යයක් වන්නේ බලය දරන්නන් විසින් බලය අයථා ලෙස යෙදවීමට පෙළඹී තිබෙන ආකාරය බවයි. ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ආකාරයට; 'බලය එක්තැන් වීම නියත ලෙසම අනතුරුදායක වේ. එය නියත ලෙසම ආඥාදායකත්වයට මග පාදනු ලැබේ. මෙය වැලැක්විය හැක්කේ ආණ්ඩුවේ බලය විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ වශයෙන් බෙදා වෙන්කොට ක්‍රියාවට නැංවුව හොත් පමණි. බලය පාලනය කළයුතු අතර එය කළ හැක්කේ බලය තවත් බලයකින් පාලනය කිරීමෙන් පමණි'.
  - මොන්ටෙස්ක්‍යු තවදුරටත් දක්වන ආකාරයට; ' සීමාවන්ට යටත් නොකරන ලද බලයක් යම් අයෙකුට හිමිවේද ඔහු නියත ලෙසම බලය අයථා ලෙස යෙදවීමට පෙළඹේ. යම් අවස්ථාවක ව්‍යවස්ථාදායක සහ විධායක බලතල එක් පුද්ගලයෙකු අත හෝ පුද්ගලයින් කිහිප දෙනෙකුගෙන් සමන්විත එක් ආයතනයක් වෙත ඒකරාශී වේද එවැනි තත්ත්වයක් තුළ නීති සම්පාදනය කරන්නා සහ නීති ක්‍රියාත්මක කරන්නා එකම පුද්ගලයෙකු හෝ එකම ආයතනයක් වන බැවින් ඒකාධිපති ස්වරූපයේ නීති ක්‍රියාත්මක වීම හේතුවෙන් මිනිස් නිදහස අහෝසි වේ. එයාකාරයටම යම් අවස්ථාවක අධිකරණ බලය ව්‍යවස්ථාදායක බලය සමග එකට එකතු වී පවතින්නේ නම් එහිදී නීති සම්පාදකයා විනිශ්චයකරුවකු වන බැවින් හිතුවක්කාරී පාලනයකට මග පාදනු ඇත.

එමෙන් ම අධිකරණය විධායකය සමග එක්තැන් වී තිබේ නම් එහි දී විධායකය නියතවශයෙන් ම හිංසාකාරී සහ පීඩාකාරී ආයතනයක් බවට පත් වේ. යම් අවස්ථාවක විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ යන ත්‍රිවිධ බලතල එක් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් මත හෝ ඒකරාශී වන විට එය මිනිස් නිදහසේ අවසානය වනු ඇත'.

- මොන්ටෙස්ක්‍යු අවධාරණය කරන්නේ අධිකාරී බලය ක්‍රියාවට නංවන ආණ්ඩුව යම් ආකාරයක සීමාවන්ට යටත් නොකළ හොත් හිතුවක්කාරී, අත්තනෝමතික සහ ආඥාදායක පාලනයක් ඇති වීමට හැකියාවක් පවතින බවත්, එබැවින් ආණ්ඩුවේ ත්‍රිවිධ බලතල එනම් විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීම එකිනෙකින් වෙන් වූ ස්වාධීන ආයතන තුනක් මගින් කළයුතු බවත්ය. මෙයට අමතරව ආයතන තුනේ ක්‍රියාකාරිත්වය එකිනෙක ආයතනයේ පෞද්ගලික ක්‍රියාකාරිත්වය මගින් සංවරණය කළයුතු බවද ඔහු තවදුරටත් කියා සිටියේය.
- මොන්ටෙස්ක්‍යුගේ න්‍යාය ආණ්ඩු බලය සංවරණය කිරීම සඳහා යොදගත හැකි ඉතාම හොඳ සහ කාර්යක්‍ෂම උපකරණයක් ලෙස පොදුවේ පිළි ගත්තද එහි ප්‍රායෝගික භාවිතය සම්බන්ධයෙන් ගැටළු කිහිපයක්ද පවතින බව විචාරකයෙක් පෙන්වා දෙති.
- එක් ගැටළුවක් වන්නේ ස්ථාවර සීමා නිර්ණයන් අනුව බලතල කාණ්ඩ තුන එකිනෙකින් වෙන් කිරීමට නොහැකි වීමය. දෙවැන්න වන්නේ ශුද්ධ බල බෙදීමක් කළහොත් ඇතිවිය හැකි ආයතනික හුදකලාභාවය හේතුවෙන් ආණ්ඩු යාන්ත්‍රණය අකාර්යක්‍ෂම වීමය. තුන්වැන්න වන්නේ විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ යන කාර්යයන් නිශ්චිත අයුරින් එකිනෙකින් වෙන් කිරීමට අපහසු වීමය. සිව්වැන්න වන්නේ බලතල බෙදීම මගින් පමණක් මිනිස් නිදහස ආරක්‍ෂා කිරීමට නොහැකි වීමය.
- මෙම වැරදීම් වලට හේතුව වැරදි පදනමක සිට බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කිරීම නිසා බව විචාරකයෙක් පෙන්වා දෙති. මොන්ටෙස්ක්‍යු බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කළේ බ්‍රිතාන්‍ය තුළ කරන ලද සංචාරයක අත්දැකීම් පදනම් කර ගෙනය. එම සංචාරයේදී ඔහුට පෙනී ගියේ මහාද්වීපික යුරෝපා ජනතාවට වඩා සාපේක්‍ෂ වශයෙන් බ්‍රිතාන්‍ය ජනතාව නිදහස භුක්ති විඳින බවත් එයට හේතුව බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ ක්‍රියාත්මක වන බලතල බෙදීම බවත්ය. නමුත් මෙම තේරුම් ගැනීම වැරදි බව යි විචාරකයින් පෙන්වා දී ඇත.

**න්‍යායේ භාවිතය**

- බලතල බෙදීමේ න්‍යාය ඇමෙරිකානු ව්‍යවස්ථා සම්පාදකයින් විසින් තම ආණ්ඩු ක්‍රමයේ මූලික පදනම ලෙස යොදාගනු ලැබීය. ඒ අනුව ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ වශයෙන් බලතල වෙන්කොට ඒවා ක්‍රියාවට නැංවීම කොන්ග්‍රස් මණ්ඩලය, ජනාධිපති සහ ශ්‍රේෂ්ඨාධිකරණය යන ආයතන තුනට පවරාදේ. එයට අමතරව ආයතන විසින් බලතල අවභාවිත කිරීම වැළැක්වීම සඳහා ඉතාම දැඩි සංවරණ හා තුලන මූලධර්ම යාන්ත්‍රණයක්ද ආණ්ඩුක්‍රමයට යා ඇත.
- ඉන් අනතුරුව ලෝකයේ රාජ්‍යයන් බොහොමයක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේදී බලතල බෙදීමේ සිද්ධාන්තය අඩුවැඩි වශයෙන් භාවිතාවට ගෙන ඇත.

**නිගමනය**

කුමන ආකාරයේ විවේචන ඉදිරිපත් වූවද ආණ්ඩුවේ ආඥාදායක පාලනයෙන් ජනතාවගේ නිදහස සහ අයිතිවාසිකම් ආරක්‍ෂා කරලීම සඳහා භාවිත කළ හැකි ආණ්ඩුක්‍රමික උපක්‍රමයක් ලෙස බලතල බෙදීමේ න්‍යාය සමකාලීන ලෝක දේශපාලනය තුළ පිළිගැනීමට ලක් ව තිබේ.

(111). **ව්‍යවස්ථානුකූලවාදය**

- **අභිමථාර්ථය**

සාමාන්‍ය ව්‍යවහාරයේදී ව්‍යවස්ථානුකූලවාදය යන්නෙන් අදහස් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන රාජ්‍යය පාලනය ක්‍රියාවට නැංවීමය. නමුත් ව්‍යවස්ථානුකූලවාදයෙන් අදහස් කරන්නේ එපමණක් ම නොවේ. ව්‍යවස්ථානුකූල පාලනයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කාලාන්තරයක් තිස්සේ දේශපාලන ක්‍රමයේ නීතිමය පදනම ලෙස පැවතීම, ජනතාවගේ ගෞරවයට හා භක්තියට ලක්වීම, අවසානයේදී ජනතාව අදහන හා විශ්වාස කරන සිවිල් ආගමක තත්ත්වයට පත්වීම යන කරුණුද ව්‍යවස්ථානුකූලවාදය යන්නෙන් අර්ථවත් වේ. මෙම ප්‍රශ්නයේ අභිමථාර්ථය වන්නේ ඉහත දැක්වූ කරුණු පිළිබඳවත් සහ මූල්බැසගත් ව්‍යවස්ථානුකූලවාදයක ඇති ප්‍රයෝජනවත්භාවය පිළිබඳවත් අපේක්ෂකයින්ගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමය.

- **පිළිතුරෙහි අන්තර්ගත විය යුතු කරුණු**

| | |
|---|---|
| **(අ). ව්‍යවස්ථානුකූලවාදයේ මූලික ලක්ෂණ** | **ලකුණු 06** |
| **(ආ). ව්‍යවස්ථානුකූලවාදයේ ප්‍රයෝජනවත්භාවය** | **ලකුණු 02** |
| **(ඇ). නිගමනය** | **ලකුණු 02** |

**ආදර්ශ පිළිතුර**

- සාමාන්‍ය ව්‍යවහාරය අනුව ව්‍යවස්ථානුකූලවාදය යනුවෙන් අදහස් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන රාජ්‍යය පාලනය පවත්වා ගෙන යාමය. එවැනි පාලන ක්‍රමයක් තුළ ව්‍යවස්ථානුකූල නීතිය උත්තරීතර වන අතර එම හේතුවෙන් ආණ්ඩුක්‍රමය තුළ නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වේ. එබැවින් ව්‍යවස්ථානුකූලවාදය ප්‍රජතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සඳහා අත්‍යවශයෙන්ම තිබිය යුතු කොන්දේසියක් ලෙස පිළිගැනේ.
- ව්‍යවස්ථානුකූල පාලනය ව්‍යවස්ථානුකූලවාදයේ අත්‍යවශ්‍යම ලක්ෂණය වූවද ව්‍යවස්ථානුකූලවාදයෙන් අදහස් වන්නේ එම කරුණ පමණක්ම නොවේ. හේතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබූ පමණින්ම රටක රටක ස්ථිරසාර ව්‍යවස්ථානුකූලවාදයක් පවතින බව එක එල්ලේම නිගමනය කිරීමට අපහසු වීමය.
- රටක ස්ථිරසාර ව්‍යවස්ථානුකූලවාදයක් ස්ථාපිත වීම කෙරෙහි බලපාන හේතු සාධක ගණනාවක් තිබේ. ඒවානම්;
    - (අ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පැවැත්ම සහ ව්‍යවස්ථානුකූල නීතිය රාජ්‍ය පාලනයේදී උත්තරීතරත්වයේ ලා සැළකීම.
    - (ආ). ව්‍යවස්ථාව කාලීන අවශ්‍යතාවන් අනුව වෙනස් වෙමින් අඛණ්ඩව ජනතාව සමග ඉදිරියට ගමන් කිරීම.
    - (ඇ). ව්‍යවස්ථාව මගින් පදනම සපයන ආණ්ඩුක්‍රමය ජනතා හිතකාමී එකක් වීම.
    - (ඈ). ව්‍යවස්ථාව මගින් නිශ්චිත ව්‍යවස්ථානුකූල දර්ශනයක් සැපයීම. එනම් සමාජ ප්‍රගමණය සඳහා ඉවහල් වන දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනයක් සැපයීම.
    - (ඉ). ව්‍යවස්ථාව නිතර නිතර වෙනස් නොකිරීම. විශේෂයෙන්ම දේශපාලනඥයින්ගේ පෞද්ගලික ඕනෑ එපාකම් අනුව ව්‍යවස්ථාව වෙනස් නොකිරීම.
    - (ඊ). අධිකරණ විවරණ බලය ක්‍රියාත්මක කිරීම. එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකතනය කිරීමේ බලය අධිකරණයට පැවරීම.
    - (උ). පාලිතයින් මෙන්ම පාලකයින්ද එකසේ ව්‍යවස්ථාවට ගරු කිරීම හා පිළිපැදීම.

- රටක ව්‍යවස්ථානුකූලවාදය ස්ථාවර ලෙස මුල්බැස ගත්විට දැකිය හැකි ලක්ෂණය වන්නේ ව්‍යවස්ථාව කෙරෙහි ජනතාව තුළ වර්ධනය වන විශ්වාසය හේතුවෙන් ව්‍යවස්ථාවට ගරු කිරීමට පෙළඹීමය. ගරු කිරීම තුළින් ජනතාව තුළ ව්‍යවස්ථානුකූල භක්තිය ඇතිවේ. ව්‍යවස්ථානුකූල භක්තිය හේතු කොටගෙන ව්‍යවස්ථාව පූජනීය දෙයක් ලෙස සැළකීමට ජනතාව පෙළඹෙන අතර එහි අවසාන ප්‍රතිඵලය වන්නේ ව්‍යවස්ථානුකූල භක්තිය සිවිල් ආගමක තත්ත්වයට වර්ධනය වීමය. මේ සම්බන්ධයෙන් දියහැකි හොඳම නිදසුන වන්නේ ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය.
- ස්ථිරසාර ව්‍යවස්ථානුකූලවාදයක් පවතින විට එමගින් ඇතිවිය හැකි වාසි රාශියක්ම තිබේ. එයින් එකක් වන්නේ ස්ථිරසාර දේශපාලන ක්‍රමයක් ගොඩනගා පවත්වා ගෙන යාමට හැකි වීමය. දෙවැන්න වන්නේ රටේ දේශපාලන ක්‍රමයට සුජාතභාවය හා ස්ථාවරභාවය එමගින් සැපයීමය. තුන්වැන්න වන්නේ දේශපාලන ක්‍රීඩාව එයට අදාල නීතිරීති අනුවම කිරීමේ පුහුණුවක් දේශපාලන ක්‍රීඩකයින්ට ලැබීමය. සිව්වැන්න වන්නේ විප්ලව හෝ කැරලි කෝලාහලවලින් තොරව දේශපාලන බලය හුවමාරු කර ගැනීමට හැකි වීමය. පස්වැන්න වන්නේ ජනතාවගේ නිදහස හා අයිතිවාසිකම් මැනවින් ආරක්ෂා කර ගැනීමට හැකි වීමය.

**නිගමනය**

ඉහත දක්වන ලද කරුණු වලින් පෙනී යන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ පදනම ව්‍යවස්ථානුකූලවාදය වන බවය. එමෙන්ම එයින් අයත් කරගත හැකි වාසි විශාල ප්‍රමාණයක්ද පවතින බවය. නමුත් රටක ස්ථිරසාර ව්‍යවස්ථානුකූලවාදයක් ගොඩනගා ගැනීමද පහසු දෙයක් නොවේ. ඒ සම්බන්ධයෙන් බලපාන එක් හේතුවක් වන්නේ ව්‍යවස්ථාව නොසළකා හරිමින් බලය ක්‍රියාවට නැංවීමට පාලකයින් පෙළඹීමය. දෙවන හේතුව වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ සමහරවිට පවතින අපූර්වතාවන්ය. තුන්වන හේතුව වන්නේ සමහරවිට විශේෂ අවශ්‍යතාවන් සඳහා වුවද ව්‍යවස්ථාව වෙනස් කිරීමට නොහැකි වීමය.

4. **පහත දක්වෙන ඒවායින් ඕනෑම දෙකක් විස්තර කරන්න.**

(1). රාජ්‍ය - පුරවැසිසම්බන්ධතාව
(11). සිවිල් සමාජය
(111). යහපාලනය

- මෙම ප්‍රශ්නයේ අන්තර්ගත වන්නේ සමකාලීන දේශපාලන කතිකාව තුළ සාකච්ඡාවට භාජනය වන ප්‍රධාන ගණයේ මාතෘකා තුනක්ය. ප්‍රශ්නයේ අභිමථාර්ථය වන්නේ මෙම මාතෘකා පිළිබඳව අපේක්ෂයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීමය. පිළිතුරු ඇගයීමේදී පහත දැක්වෙන කරුණු වලට අවධානය යොමු කරන්න.

**(අ). මාතෘකාව ගැන අපේක්ෂකයා පෙන්නුම් කරන අර්ථ ග්‍රහණයේ ප්‍රමාණවත් භාවය** — **ලකුණු 02**
**(ආ). මාතෘකාව පිළිබඳ න්‍යායාත්මක දැනුම** — **ලකුණු 03**
**(ඇ). දේශපාලන විද්‍යාත්මක වැදගත්කම** — **ලකුණු 03**
**(ඈ). පිළිතුරෙහි ඇති හරයාත්මක වැදගත්කම** — **ලකුණු 02**

(i) **රාජ්‍ය-පුරවැසි සම්බන්ධතාව**

**ආදර්ශ පිළිතුර සාරාංශ වශයෙන්**

- රාජ්‍යය සහ පුරවැසිභාවය යනු අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක මත රඳා පවතින දේශපාලන සංසිද්ධීන් දෙකකි. නූතන රාජ්‍යයෙහි විශේෂයෙන් ප්‍රකාශ වන පරිදි රාජ්‍යයක් සංස්ථාපනය වන්නේ පුරවැසි සමූහයකින් යුතු දේශපාලන

ප්‍රජාවක් වශයෙනි. එමෙන්ම පුරවැසි සමූහයක් දේශපාලන ප්‍රජාවක් ලෙස පවතින්නේ ඔවුන් රාජ්‍යයක් තුළ සංවිධානය වී සිටින විටය.

- ඒ අනුව මනුෂ්‍යයන් පුරවැසියන් වන්නේ රාජ්‍යයක් තුළ සහ රාජ්‍යයක් හා සම්බන්ධවය. රාජ්‍යය රාජ්‍යයක් වන්නේ එය දේශපාලන වශයෙන් සංවිධානය වූ පුරවැසි සමූහයකගේ දේශපාලන අධිෂ්ඨානය කැටිකර ගන්නා හෙයිනි.
- ''පුරවැසිභාවය''යන්නට ඇති අර්ථකථන ආශ්‍රයෙන් ද අපට රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධය දැකිය හැකිය. පුරවැසිභාවය යනු රාජ්‍යයක සාමාජිකත්වයයි. තනි පුද්ගල මනුෂ්‍යයෙකු පුරවැසියෙකු වන්නේ රාජ්‍යයේ සාමාජිකත්වය ලබන නිසාය. රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධය දේශපාලන සම්බන්ධයක් ද වේ.
- එම දේශපාලන සම්බන්ධතාවයේ ලක්ෂණය නම් අයිතිවාසිකම් සහ වගකීම් සමූහයක් මාධ්‍යය කොටගෙන රාජ්‍යය සහ පුරවැසියන් එකිනෙකා සමග ගනුදෙනු කිරීමයි. රාජ්‍යයේ පුරවැසිභාවය ලබන එහි සාමාජිකයින්ට ආරක්ෂාව සැපයීම, ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරිත්වයට අවශ්‍ය අවකාශය සහ ආයතන සැපයීම, පුරවැසියන් අතර ඇති ගැටුම් නිරාකරණය සහ සාධාරණ ලෙස ආරාවුල් විසඳීම රාජ්‍යය සතු වගකීම් ය. ඊට හුවමාරු වශයෙන් පුරවැසියෝ තම පක්ෂපාතිත්වය රාජ්‍යය වෙතට පළකරති, අයබදුගෙවති, යහපත් පුරවැසියන් ලෙස ක්‍රියා කරති. මේවා රාජ්‍යය සහ පුරවැසියන් පිළිබඳව දේශපාලන න්‍යායෙන් අවධාරණය කෙරේ.
- නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය තුළ රාජ්‍යය සහ පුරවැසියා අතර මෙම සම්බන්ධය තීරණය කිරීමේ දී මූලික අයිතිවාසිකම් වලින් ඉටුකෙරෙන්නේ තවත් වැදගත් කාර්යයකි. රාජ්‍යය පුරවැසියන්ගේ දේශපාලන පක්ෂපාතිත්වය සහ රාජ්‍යයේ බලයට කීකරු වීම අපේක්ෂා කරන ගමන්ම, පුරවැසියන්ගේ නිදහස සහතිකකිරීම ද රාජ්‍යයේ වගකීමක් ලෙස සැළකේ. මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියක් නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල පැවතිය යුතුයැයි සැළකෙන්නේ එබැවිනි. එය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවද පිළිබඳ දේශපාලන න්‍යායෙන්ද අවධාරණය වේ.
- අවසාන වශයෙන් කිව හැක්කේ රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධතාව තීරණය කරන පදනම් ලේඛනය බවයි. එ මගින් සමාජය වෙත රාජ්‍යය සතු වගකීම් හා කාර්යභාරයන් ද, පුරවැසියන් රාජ්‍ය සමග ඇති බැඳීමේ නෛතික සහ මූලධර්මික පදනම් ද ප්‍රකාශ වේ.

**(ii) සිවිල් සමාජය :**

- නූතන දේශපාලන න්‍යායට එකතු වී ඇති මෙම සංකල්පයෙන් මූලික වශයෙන් අදහස් වන්නේ, රාජ්‍යයෙන් ස්වාධීනව, තම පොදු අවශ්‍යතා සඳහා සාමූහිකව හෝ කණ්ඩායම් හෝ වශයෙන් ක්‍රියාකිරීමට පුරවැසියන්ට ඇති අවකාශයයි. මෙය නූතන ධනවාදී සමාජයේ ද, ප්‍රජාතන්ත්‍රවාදයේ ද ඇති විශේෂ ලක්ෂණයක් ලෙස ද සැළකේ. සිවිල් සමාජය පිළිබඳ දේශපාලන න්‍යායේ ඒකමතිකත්වයක් නැත. හේගල් සහ මාක්ස් ඉදිරිපත් කළ සිවිල් සමාජය පිළිබඳ සම්භාව්‍ය ප්‍රවේශයේ ''සිවිල්සමාජය''යන සංකල්පය යොදා ගනු ලැබුවේ''ධනවාදී වෙළඳපොල''යන අර්ථයෙනි. එහි දී හේගල් ''සිවිල් සමාජය''දුටුවේ පුද්ගල නිදහසේ අවකාශය ලෙසයි. ඊට පටහැණිව මාක්ස් සිවිල් සමාජය දුටුවේ පුද්ගල ආත්මාර්ථකාමිත්වයේ අවකාශය ලෙසය. එහෙත් පසුකාලයේ දී ''සිවිල් සමාජය''යන්නට ඊට බෙහෙවින් වෙනස් අර්ථයක් ලැබිණ. තම පොදු අභිලාෂ ඉටුකර ගැනීමට, ආණ්ඩුවෙන් ද දේශපාලන පක්ෂවලින් ද ස්වාධීනව පුරවැසියන් පිහිටුවන සංවිධාන සහ එම සංවිධාන පිහිටුවා ගැනීමට පුරවැසියන් සතු සමාජ අවකාශය හැඳින්වීමටත් එම සංකල්පය භාවිතා කෙරිණ. **ඇමෙරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය** යන කෘතිය ලියූ ඇලෙක්සි ද තොක්විල් නම් දේශපාලන චින්තකයා මෙම නව අර්ථයේ පුරෝගාමිකයෙකි.''සිවිල්''යන වචනයේ ඇති''පුරවැසි''යන අර්ථය මෙම නව අර්ථකථනයෙන් අවධාරණය වේ. පුරවැසි සහභාගිත්වය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට වැදගත් වන්නේය යන අදහස එයින් අවධාරණය වේ.
- සිවිල් සමාජ ව්‍යාපාර, දේශපාලන පක්‍ෂවලට සමාන්තර දේශපාලන ආයතනික ප්‍රකාශන ලෙස ද නූතන ප්‍රජාතන්ත්‍රවාදි න්‍යාය තුළ සැළකේ. දේශපාලන පක්‍ෂවල න්‍යාය පත්‍රයට ඇතුල් කර නොගන්නා මහජන ඉල්ලීම් සහ ප්‍රතිපත්ති යන කාරණා සිවිල් සමාජ ව්‍යාපාර වල න්‍යාය පත්‍රවලින් අවධාරණය කිරීම එයට හේතුවයි.
- නූතන ප්‍රජාතන්ත්‍රවාදය තුළ සිවිල් සමාජයට විශේෂ වැදගත්කමක් ලැබේ. පුරවැසියෝ සිය පොදු අරමුණු සඳහා විවිධ සංවිධාන පිහිටුවා ගනිති. එමෙන්ම තම අරමුණු දිනා ගැනීමට සමාජ ව්‍යාපාර ගොඩ නගති. ස්වේච්ඡා සමිති, වෘත්තීය සමිති, කම්කරු ව්‍යාපාර, ගොවි ව්‍යාපාර, ස්ත්‍රී ව්‍යාපාර හා ශිෂ්‍ය ව්‍යාපාර මේවාට නිදසුන්ය. මෙවැනි සිවිල් සමාජ ව්‍යාපාර පැවතීමත්, ඒවා සක්‍රීයව පැවතීමත්, පුරවැසි දේශපාලන සහභාගිත්වයේ මාධ්‍යයක් ද වේ. එබැවින් ''සිවිල් සමාජය''යන්න නූතන ප්‍රජාතන්ත්‍රවාදයට ද, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ න්‍යායට ද වැදගත් වේ.

- මෙම යෝජනා මගින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය වර්ධනය වීමට දායක වූ ආකාරය පහත සඳහන් පරිදි වේ.
    - (අ). මැතිවරණ ක්‍රියාදාමය හරහා පාලකයින් පත්කර ගැනීමට හා වෙනස් කිරීමට ජනතාව හුරු පුරුදු වීම.
    - (ආ). දේශපාලනඥයින් ජනතාවට වගකීම පිළිබඳව හුරු පුරුදු වීම
    - (ඇ). ජනතාවගේ දේශපාලන සහභාගිත්වය වර්ධනය වීම
    - (ඈ).ජනතාව දේශපාලන සමාජානුයෝජනය වීමේ ක්‍රියාදාමය වේගවත් වීම සහ එම හේතුවෙන් ජනතාව දේශපාලන වශයෙන් සවිබලමත් වීම වර්ධනය වීම සහ එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට දේශපාලනඥයින්ට බලපෑම් කළහැකි ප්‍රමාණය ඉහල යාම.
    - (ඉ). ආණ්ඩුකරණය සම්බන්ධයෙන් කෙරෙන වගකීම පිළිබඳව දේශපාලනඥයින් හුරු පුරුදු වීම.
    - (ඊ). විධායක හා ව්‍යවස්ථාදායක කාර්යයන් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ලාංකික දේශපාලනඥයින් පුරුදු පුහුණු වීම.
    - (උ). කැබිනට් ආණ්ඩුක්‍රමයකට දේශපාලනඥයින් හුරු පුරුදු වීම
    - (ඌ). දේශපාලන පක්ෂ ආරම්භ වීමේ පදනම වැටීම
    - (ඔ). වාර්ගික මානසිකත්වය සමනය වීම කෙරෙහි බලපෑම

- ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ වර්ධනය කෙරෙහි ඩොනමෝර් යෝජනා වලින් ඇති වූ අහිතකර ප්‍රතිඵල කිහිපයක්ද හඳුනා ගතහැක. මෙයින් එකක් වන්නේ විධායක හා ව්‍යවස්ථාදායක කාර්යයන් පිළිබඳව පූර්ණ බලයක් ලාංකිකයින්ට පවරා නොදිමය. දෙවන දුර්වලතාව වූයේ සමහර අවස්ථාවන්හිදී ආණ්ඩුකාරයා හා රාජ්‍යය නිලධාරීන් තිදෙනාගේ අනවශ්‍ය මැදිහත් වීම හේතුවෙන් සමහර ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණ සම්ප්‍රදායන් වර්ධනය වීම අඩපණ වීමය. තුන්වැන්න වූයේ සාමූහික වගකීමේ ආණ්ඩුකරණයට ලාංකික දේශපාලනඥයින් හුරු පුරුදු වීම අඩපණ වීමය.

**නිගමනය**

ඉහත සඳහන් අඩුපාඩු තිබුනද මෙරට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය වර්ධනය වීම හා මුල්බැස ගැනීම සම්බන්ධයෙන් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් සිදුවූ දායකත්වය විශිෂ්ඨ වන බව අවසාන වශයෙන් කිවහැක.

7. **පහත දැක්වෙන ආයතන අතුරෙන් ඕනෑම දෙකක් පිළිබඳව සාකච්ඡා කරන්න.**

(1). සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය
(11). 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය
(111). සෝල්බරි ව්‍යවස්ථාව හා 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය

(1). **සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය**

- **අභිමථාර්ථය**

කැබිනට් ආණ්ඩුක්‍රමයක එක් මූලික ලක්ෂණයක් වන්නේ දේශපාලන විධායකය නාමික හා සත්‍ය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වීමය. මේ අනුව 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ දේශපාලන විධායකයද නාමික විධායකය හා සත්‍ය විධායකය යන කොටස් දෙකෙන් සමන්විත වූ අතර නාමික විධායකය හැඳින්වූයේ අග්‍රාණ්ඩුකාරවරයා යන නිල නාමයෙනි. මෙම ප්‍රශ්නයේ අභිමථාර්ථය වන්නේ එම නාමික විධායකය පත්කළ ආකාරය, තනතුරෙන් ඉවත් කරන ආකාරය, තනතුරට හිමිව තිබූ බලතල, කාර්යයන් සහ තත්ත්වය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමය.

- **පිළිතුරෙහි අන්තර්ගත වියයුතු මූලික කරුණු**
    - **(අ). පත් කරන සහ ඉවත් කරන ආකාර ලකුණු 02**
    - **(ආ). බලතල, කාර්යයන් හා තත්ත්වය ලකුණු 05**
    - **(ඇ) අග්‍රාණ්ඩුකාර ධුරය පිළිබද ලංකාවේ අත්දැකීම් ලකුණු 01**
    - **(ඈ). නිගමනය ලකුණු 02**

**ආදර්ශ පිළිතුර**

- කැබිනට් ආණ්ඩුක්‍රමයේ එක් ප්‍රධාන ලක්ෂණයක් වන්නේ දේශපාලන විධායකය නාමික සහ සත්‍ය යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වීමය. 1947 දී බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින් විසින් ශ්‍රී ලංකාවට කැබිනට් ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන් අතර එම ආණ්ඩුක්‍රමයේ නාමික විධායකය හිමිවූයේ බ්‍රිතාන්‍ය කිරීටයටය. හේතුව වූයේ ශ්‍රී ලංකාවට හිමිවූයේ ඩොමීනියන් තත්ත්වයේ නිදහසක් පමණක් වීමත් ඒ අනුව බ්‍රිතාන්‍ය කිරීටය ලංකා ආණ්ඩුක්‍රමයේ නිල නායකත්වය තවමත් දැරීමත්ය.
- එසේවූවද කිරීටය දරන පුද්ගලයා ලංකාවේ වාසය නොකළ බැවිනුත්, ලංකාව හා බ්‍රිතාන්‍ය අතර පවතින් දුරස්තරභාවය නිසාත් ලංකාණ්ඩුක්‍රමය තුළ බ්‍රිතාන්‍ය කිරීටය නියෝජනය කිරීම සඳහා නියෝජිතයෙකු පත් කරන අතර සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ නාමික විධායකය ලෙස හැඳින්වූයේ මෙම නියෝජිතයාය. ඔහු අග්‍රාණ්ඩුකාරවරයා යන නිල නාමයෙන් හැඳින්වින.
- නාමික විධායකය සම්බන්ධයෙන් අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ ක්‍රියාත්මක වූ සම්ප්‍රදායන් පහත සඳහන් පරිදි විය.
    - (අ). ලංකාවේ අගමැතිවරයාගේ උපදෙස් පරිදි බ්‍රිතාන්‍ය කිරීටය විසින් පත් කිරීම.
    - (ආ). ධුර කාලය ව්‍යවස්ථාවේ සඳහන් වූයේ නැත. එසේවූවද වසර පහෙන් පහට අළුතින් පත් කිරීමේ සම්ප්‍රදාය අනුගමනය කරන ලදි.
    - (ඇ). එකම පුද්ගලයා තනතුරට පත්කිරීමේ වාර ගණන පිළිබඳව සීමාවක් නොවීය.
    - (ඈ). ලංකාවේ අගමැතිවරයාගේ උපදෙස් මත බ්‍රිතාන්‍ය කිරීටය විසින් තනතුරෙන් ඉවත් කළහැකි විය.
- ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන්නේ නාමික විධායකය පත් කිරීම, ධුරයේ රැඳී සිටිය හැකි නිල කාලය තීරණය වීම සහ ධුරයෙන් ඉවත් කිරීම යනාදී සියල්ල තීරණය වූයේ ලංකාවේ අගමැතිවරයාගේ අභිමතය අනුව බව.

**බලතල, කාර්යයන් හා තත්ත්වය**

- අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල හා කාර්යයන් සෝල්බරි ව්‍යවස්ථාවේ සඳහන් කර තිබුණි. ඒ අනුව අග්‍රාණ්ඩුකාරවරයා රාජ්‍යයේ නායකයා, විධායකයේ ප්‍රධානියා සහ සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා විය. මෙයට අමතරව තම කාර්යයන් ඉටු කිරීමේදී අග්‍රාණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය සම්ප්‍රදායන් අනුගමනය කළයුතු විය. අග්‍රාණ්ඩුකාරවරයා සතු වූ බලතල හා කාර්යයන් ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ සහ චාරිත්‍රානුකූල යන අංශ හතර යටතේ පහත සඳහන් ආකාරයට දැක්විය හැක.
- **ව්‍යවස්ථාදායක බලතල හා කාර්යයන්**
    - (අ). අගමැතිගේ උපදෙස් මත පාර්ලිමේනතුව කැඳවීම, කල්තැබීම සහ විසුරුවා හැරීම
    - (ආ). පාර්ලිමේන්තුවේ සැසිවාර ආරම්භයේදී රාජාසන කථාව පැවැත්වීම
    - (ඇ). මංගල අවස්ථාවන්හිදී පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම
    - (ඈ). පාර්ලිමේන්තු පනත්වලට අවසාන අනුමැතිය දීම
    - (ඉ). සෙනෙට් සභාව සඳහා නාමකරණයෙන් පත්කළ යුතු සාමාජිකයින 15 දෙනා පත්කිරීම

(ඊ). සුළුජන කොටස් වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නියෝජිතයින් 06 දෙනෙක් නාමකරණයෙන් පත්කිරීම
(උ). නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට ලේකම්වරුන් පත්කිරීම

- **විධායක බලතල හා කාර්යයන්**

(අ). අගමැතිවරයා පත්කිරීම. අගමැතිවරයාගේ උපදෙස් මත කැබිනට් මණ්ඩලයේ සෙසු සාමාජිකයින් හා නියෝජ්‍ය ඇමතිවරුන් පත්කිරීම
(ආ). අමාත්‍යවරුන්ට හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ට අමාත්‍යාංශ, කාර්යයන් සහ වගකීම් පැවරීම
(ඇ). ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ පොලිස්පති පත්කිරීම
(ඈ). අමාත්‍යාංශවල ස්ථිර ලේකම්වරු, උසස් රාජ්‍ය නිළධාරීන් සහ කැබිනට් මණ්ඩලයේ ලේකම්වරයා පත්කිරීම
(ඉ). විදේශ තානාපතිවරුන්, මහකොමසාරිස්වරුන් සහ වෙනත් රාජ්‍ය උපාය නිලධාරීන් පත්කිරීම සහ ඉවත් කිරීම සහ එවැනි විදේශ තානාපතිවරුන්, මහකොමසාරිස්වරුන් සහ වෙනත් රාජ්‍ය උපාය නිළධාරීන් පිළිගැනීම
(ඊ). රාජ්‍ය මුද්‍රාව පරිහරණය කිරීම

- **අධිකරණය හා සම්බන්ධ බලතල හා කාර්යයන්**

(අ). අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ සෙසු විනිශ්චයකරුවන් සහ අපරාධ විනිශ්චය කොමසාරිස්වරුන් පත්කිරීම සහ ඉවත් කිරීම
(අ). අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා හැර සෙසු සාමාජිකයින් පත්කිරීම
(ඇ). වරදකරුවන්ට සමාව දීම

- **චාරිත්‍රානුකූල කාර්යයන්**

ජාතික උත්සව වලදී මුලසුන ගැනීම, නම්බුනාම ප්‍රදානය කිරීම, ජාතික මට්ටමේ විවෘත කිරීම් වලට සහභාගි වීම යනාදිය.

- **අග්‍රාණ්ඩුකාර ධූරය පිළිබඳ ලංකාවේ අත්දැකීම්**

1948 - 1972 කාලය තුළ පුද්ගලයින් සිව් දෙනෙකු අග්‍රාණ්ඩුකාර ධූරය දැරුවේය. කැබිනට් ආණ්ඩුක්‍රමයක නාමික විධායකය අපක්ෂපාතීව කටයුතු කළ යුතු බව අපේක්ෂා කළත් ලංකාවේ එය එසේ සිදුවූයේ නැත. අග්‍රාණ්ඩුකාර ධූරය දැරූ දෙවැන්නා වන සෝල්බරි සාමිවරයා 1951 වර්ෂයේදී අගමැතිවරයා පත් කිරීමේදීත්, තුන්වන අග්‍රාණ්ඩුකාරවරයා වන ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක 1958 හදිසි අවස්ථා තත්ත්වයේදීත්, 1960 මාර්තු මැතිවරණයෙන් පසුව ආණ්ඩුව පත්කිරීම පිළිබඳවත් සහ 1962 හමුදා කුමන්ත්‍රණය යන අවස්ථා වලදීත් ක්‍රියාකළ ආකාරය දේශපාලන මතභේද වලට ලක්විය.

- එසේවූවද අනෙකුත් අවස්ථාවලදී අග්‍රාණ්ඩුකාරවරු ධූරයෙන් අපේක්ෂා කළ පරිදි අපක්ෂපාතීව තම රාජකාරි කටයුතු ඉටුකරන ලදි. විශේෂයෙන්ම 1964-1972 කාලය තුළ එම ධූරය දැරූ විලියම් ගොපල්ලව නාමික විධායක තනතුරින් අපේක්ෂා කළ මධ්‍යස්ථභාවය ආරක්ෂා කරමින් ක්‍රියා කළේය.

- **නිගමනය**

කැබිනට් ආණ්ඩුක්‍රමයක නාමික විධායකය ගෞරවාන්විත ධූරයක් වූවද ලංකාවේ සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ නාමික විධායක ධූරය වූ අග්‍රාණ්ඩුකාරවරයා පත්කල ආකාරය, ඉවත් කිරීමේ ක්‍රමවේදය සහ ධූරයට පවරන ලද බලතල හා කාර්යයන් අනුව නාමික විධායකය සැළකිය හැක්කේ ජාතික නායකයෙකු ලෙස නොව විදේශ රාජ්‍යයක නියෝජිතයෙකු ලෙසය.

## (11). 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය

- **අභිමතාර්ථය**

  කැබිනට් හෙවත් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක සත්‍ය විධායකය ලෙස හඳුන්වන්නේ අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයයි. කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායක බලතල සත්‍ය වශයෙන් භුක්ති විඳින්නේ සහ ක්‍රියාවට නංවන්නේ සත්‍ය විධායකය විසිනි. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ද ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කළේ කැබිනට් ආණ්ඩුක්‍රමයක්ය. එහි සත්‍ය විධායකය වූයේ අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයයි. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටවූ සත්‍ය විධායකයේ ස්වරූපය, එය තේරී පත් වූ ආකාරය සහ එය සතු වූ බලතල යනාදී කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

- **පිළිතුරෙහි අඩංගු වියයුතු මූලික කරුණු**

| | |
|---|---|
| **(අ). සත්‍ය විධායකය තේරීපත් වූ ආකාරය** | **ලකුණු** 02 |
| **(ආ). බලතල හා කාර්යයන්** | **ලකුණු** 04 |
| **(ඇ). ව්‍යවස්ථාදායකයට වගකීමේ අවශ්‍යතාවය** | **ලකුණු** 01 |
| **(ඈ). නිල කාලය අවසන් වීම/ඉවත් කිරීම** | **ලකුණු** 02 |
| **(ඉ). නිගමනය** | **ලකුණු** 01 |

### ආදර්ශ පිළිතුර

- 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සත්‍ය විධායකය අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය වූ අතර එය දේශපාලන විධායකය ලෙසද හැඳින්වින. එසේ හැඳින්වීමට හේතුව වන්නේ දේශපාලන පසුබිමක් මත අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය තේරීපත් වීමය.

- 1972 ව්‍යවස්ථාවට අනුව අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකය වූ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන් අතුරින් තෝරා පත් කරගත යුතු විය. 1972 ව්‍යවස්ථාවේ අගමැතිවරයා තෝරාපත් කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් වූ අතර ඒ අනුව ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයින්ගේ උපරිම විශ්වාසය දිනා ගන්නා මන්ත්‍රීවරයා අගමැති තනතුරට නාමික විධායකය වූ ජනාධිපතිවරයා විසින් තෝරා පත් කළ යුතු විය.

- කැබිනට් මණ්ඩලයේ සෙසු සාමාජිකයින් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් අගමැතිවරයාගේ නිර්දේශය මත නාමික විධායකය විසින් ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයින් අතුරෙන් පත් කළ යුතු විය. මේ අනුව 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය සම්බන්ධයෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වූයේ එය ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයින්ගෙන් පමණක් සංයුක්ත වීමය.

- නිල කාලය අවසන් වීමට ප්‍රථමයෙන් සත්‍ය විධායකය බලයෙන් පහකිරීමේ විධික්‍රම දෙකක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් විය. එම විධික්‍රම දෙක වූයේ;
  1. අගමැතිවරයාගේ ඉල්ලීම පරිදි නාමික විධායකය විසින් කැබිනට් මණ්ඩලයේ සමාජිකයින් තනිතනිව තනතුරු වලින් ඉවත් කිරීම හෝ අගමැතිවරයාගේ ඉල්ලීම පරිදි නාමික විධායකය විසින් ජාතික රාජ්‍ය සභාව විසුරුවා හැරීම මගින් සමස්ථ කැබිනට් මණ්ඩලයම තනතුරු වලින් ඉවත් කිරීමට අගමැතිවරයාට තිබූ බලය.
  2. ජාතික රාජ්‍ය සභාව විසින්. මේ යටතේ වාර්ෂික අයවැය ලේඛනයට අනුමැතිය නොදීමෙන්, ජාතික රාජ්‍ය සභාවේ පළමු සැසිවාරයේදී ඉදිරිපත් කරන රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුමැතිය නොදීමෙන් සහ සත්‍ය විධායකයට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් සත්‍ය විධායකය නිලයෙන් ඉවත් කිරීමේ බලය ජාතික රාජ්‍ය සභාව සතු විය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනරජයේ පාලනය හා මෙහෙයවීම පිළිබඳ වගකීම පැවරී තිබුණේ සත්‍ය විධායකයටය. මේ සම්බන්ධයෙන් සත්‍ය විධායකය ජාතික රාජ්‍ය සභාවට සාමූහිකව වගකීමට හා උත්තර දීමට බැඳී සිටියේය. මෙම බැඳීම මගින් තවත් එක් කරුණක් ගම්‍ය විය. එනම් සත්‍ය විධායකයට ධුරයේ රැඳී සිටීමට හැකිවූයේ ජාතික රාජ්‍ය සභාවේ උපරිම විශ්වාසය තිබෙනතාක් කල් පමණක් ය යන්නය.
- 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකයේ නායකයා වන අගමැතිවරයාට සුවිශේෂී තත්ත්වයක් හිමිකර දී තිබුන ආකාරය දැකිය හැක. මේ අනුව අගමැතිවරයා ක්‍රියාකාරී විධායකය ලෙස කටයුතු කළේය. ඔහු කැබිනට් මණ්ඩලයේ මෙන්ම ආණ්ඩුවේද නායකයා විය.

  එබැවින් රට අභ්‍යන්තර වශයෙන් මෙන්ම බාහිර වශයෙන්ද කුමන දිශාවකට ගමන් කළ යුතුද යන්න තීරණය කළේ අගමැතිවරයා විසිනි. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම, ජාතික රාජ්‍ය සභාව කැඳවීම, කල්තැබීම සහ විසුරුවා හැරීම, සත්‍ය විධායකයේ සෙසු අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් පත්කිරීම, ව්‍යවස්ථා අධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සහ ශ්‍රෙෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත්කිරීම, විදේශ දූතයින් පිළිගැනීම, තානාපතිවරුන්, මහකොමසාරිස්වරුන් හා වෙනත් රාජ්‍ය උපාය නිලධාරීන් පත්කිරීම, වරදකරුවන්ට සමාව දීම යනාදී බලතල නාමික විධායකය විසින් ක්‍රියාවට නංවන බව බාහිර වශයෙන් පෙනී ගියද සත්‍ය වශයෙන්ම ඒ සෑම බලයක්ම ක්‍රියාවට නැංවූයේ අගමැතිවරයා විසිනි.
- 1972 ව්‍යවස්ථාවට අනුව සත්‍ය විධායකය තේරී පත් වූයේ ව්‍යවස්ථාදායකය තුළිනි. එම හේතුවෙන් සත්‍ය විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටියේය. වගකීම කඩකරන විට විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් සත්‍ය විධායකය නිලයෙන් ඉවත් කිරීමේ බලය ව්‍යවස්ථාදායකය සතුවිය. අනෙක් අතට ව්‍යවස්ථාදායකය තමන් කැමති ඕනෑම අවස්ථාවක විසුරුවා හැරීමේ බලය සත්‍ය විධායකයේ නායකයා වන අගමැතිවරයා සතුවිය. මෙම කිට්ටු සම්බන්ධතාව මගින් පෙන්නුම් කළේ විධායකය සහ ව්‍යවස්ථාදායකය අන්‍යොන්‍ය වශයෙන් එකක් මත රඳා පවතින බව සහ එකක සහයෝගය නොමැතිව අනෙකට පැවැත්මක් නොමැති බවය.
- 1972 ව්‍යවස්ථාව යටතේ ස්ථිර විධායකය සම්බන්ධයෙන්ද සැළකිය යුතු බලයක් සත්‍ය විධායකයට හිමිව තිබුණි. ස්ථිර විධායකයේ සේවකයින් පත්කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම යන කරුනු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය හා වගකීම හිමිව තිබුණේ සත්‍ය විධායකයටය.

**නිගමනය**

ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන්නේ 1972 ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ දේශපාලන සංස්ථා අතුරින් සත්‍ය විධායකයට සුවිශේෂී තත්ත්වයක් හිමිවන බවය. සත්‍ය වශයෙන්ම ආණ්ඩුක්‍රමයේ කප්පිත්තා වූයේ සත්‍ය විධායකයයි. ආණ්ඩුක්‍රමය පාලනය කිරීම හා මෙහෙයවීම කරනු ලැබූයේ සත්‍ය විධායකය විසිනි. එමෙන්ම ආණ්ඩුක්‍රමයේ අනෙක් වැදගත් දේශපාලන සංස්ථා දෙක වූ නාමික විධායකය සහ ජාතික රාජ්‍ය සභාව ක්‍රියාත්මක වූයේ සත්‍ය විධායකයේ අණසකට යටත්වය. එපමණක් නොව ස්ථිර විධායකය ක්‍රියාත්මක වූයේ සත්‍ය විධායකයේ අණසකට යටත්වය. මෙයින් පෙනී යන්නේ 1972 ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ ආණ්ඩුක්‍රමය තුළ සත්‍ය විධායකය කොතරම් බලසම්පන්න ආයතනයක් වූවාද යන්නයි.

(111). **සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය**

- **අභිමථාර්ථය**

ආණ්ඩුක්‍රමයක නීති පනවන ආයතනය ව්‍යවස්ථාදායකය ලෙස හඳුන්වනු ලැබේ. නමුත් නීති පැනවීමට අමතරව තවත් කාර්යයන් කිහිපයක්ම නූතනයේ ව්‍යවස්ථාදායක සභා විසින් කරනු ලැබේ. මෙමෙ කරනු ලබන කාර්යයන්හි ස්වභාවය තීරණය වන්නේ ව්‍යවස්ථාදායක සභා වලට පවරා ඇති බලතල අනුවය. ව්‍යවස්ථාදායක සභා ප්‍රමාණයෙන් විශාල ආයතන වන අතර සාමාන්‍යයෙන් සමන්විත වන්නේ ජනතාවගේ ඡන්දයෙන් තෝරා පත් කරන ගිහි නියෝජිතයන්ගෙනි. මෙයින් පෙනී යන්නේ ව්‍යවස්ථාදායක සභාවන්හි ක්‍රියාකාරිත්වය කෙරෙහි ඒවායේ සංයුතිය සහ පවරා ඇති බලතල තීරණාත්මක ලෙස බලපාන බවය. මෙම ප්‍රශ්නයේ අභිමථාර්ථය වන්නේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායක සභාවල තත්ත්වය ඉහත සඳහන් කළ මූලික කරුණු පදනම් කරගෙන තුලනාත්මකව විශ්ලේෂනය කිරීමේ අපේක්ෂකයින්ගේ හැකියාව මැන බැලීමය.

- **පිළිතුරෙහි අන්තර්ගත වියයුතු මූලික කරුණු**

| | |
|---|---|
| **(අ). සංවිධාන ව්‍යුහය හා සංයුතිය** | **ලකුණු 02** |
| **(ආ). නිලකාලය හා විසුරුවා හැරීම** | **ලකුණු 02** |
| **(ඇ). බලතල හා කාර්යයන්** | **ලකුණු 04** |
| **(ඈ). නිගමනය** | **ලකුණු 02** |

**ආදර්ශ පිළිතුර**

- 1948 සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යන ව්‍යවස්ථා දෙක යටතේම ක්‍රියාත්මක වූයේ කැබිනට් මාදිලියේ ආණ්ඩුක්‍රමයක්ය. එසේවූවද එම ව්‍යවස්ථා දෙක යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායක සභා දෙක සංයුතිය, සංවිධාන ව්‍යුහය සහ බලතල හා කාර්යයන් අනුව එකිනෙකින් බෙහෙවින් වෙනස් විය.
- 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායකය හැඳින්වූයේ පාර්ලිමේන්තුව යන නාමයෙනි. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායකය ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්වින. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ පාර්ලිමේන්තුව ද්විමණ්ඩලික ආයතනයක් විය. එම මණ්ඩල දෙක හැඳින්වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය වශයෙනි. සාමාන්‍ය ව්‍යවහාරයේදී පහළ මණ්ඩලය සහ ඉහළ මණ්ඩලය යනුවෙන්ද මෙමෙ ආයතන දෙක හඳුන්වන ලදි. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළේ ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක්ය. මීට ඉහතින්ද සඳහන් කළ පරිදි එය ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්වින.
- 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සමන්විත වූයේ දෙවර්ගයක මන්ත්‍රීවරුන්ගෙනි. මෙයින් එක් වර්ගයක් වූයේ සරල බහුතර නියෝජන ක්‍රමය අනුව ජනතාවගේ ඡන්දයෙන් තෝරා පත් කරගත් නියෝජිතයින්ය. මෙමෙ මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සීමා නීර්ණය කිරීමේ කොමිෂන් සභාව විසින් ඡන්ද කොට්ඨාස බෙදන ආකාරය අනුව තීරණය විය. සෑම අවුරුදු 10 ට වරක්ම ගනු ලබන ජනසංගණනය අනුව මෙමෙ බෙදීම කරනු ලැබීය. මේ අනුව සෑම ජනසංගණනයකින් පසුවම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ජනතා ඡන්දයෙන් තෝරන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව වෙනස් විය. අනෙක් මන්ත්‍රී වර්ගය වූයේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් පත්කළ මන්ත්‍රීවරුන්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නාමකරණයෙන් පත්කළ යුතු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව 06 ක් විය.

- සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාදායකයේ දෙවන මණ්ඩලය වූ සෙනෙට් සභාව සමන්විත වූයේ මන්ත්‍රීවරුන් 30 දෙනෙකුගෙන්ය. මෙයින් 15 දෙනෙකු අගමැතිවරයාගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් පත්කළ අතර ඉතිරි 15 දෙනා පාර්ලිමේන්තුව නියෝජනය කළ දේශපාලන පක්ෂ විසින් මාරු කළහැකි තනි ඡන්ද ක්‍රමය අනුව තෝරා පත් කරනු ලැබිය. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය අඛන්ඩව ක්‍රියාත්මක වූ අතර මුළු සාමාජිකයින්ගෙන් 1/3 ක් සෑම වසර දෙකකට වරක්ම අළුතින් තෝරා පත් කරන ලදි.
- 1972 ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ජාතික රාජ්‍ය සභාව සමන්විත වූයේ ජනතාවගේ ඡන්දයෙන් තෝරා පත් කරගත් නියෝජිතයින්ගෙන් පමණි. නියෝජිතයින් තෝරා පත් කළේ ප්‍රාදේශීය ඡන්ද කොට්ඨාශ පදනම් කරගෙන සරල බහුතර නියෝජන ක්‍රමය යටතේය. ව්‍යවස්ථාවට අනුව වසර 10 ට වරක් පවත්වන ජනසංගණනය පදනම් කරගෙන මන්ත්‍රී ආසන සංඛ්‍යාව යළි බෙදා හැරිය යුතු විය. අවසාන සංගණනය අනුව 1977 දී මන්ත්‍රී ධුර සංඛ්‍යාව 168 ක් විය.
- සෝල්බරි ව්‍යවස්ථාදායකයේ නිල කාලය වසර 5 ක් වූ අතර සහ 1972 ව්‍යවස්ථාදායකයේ නිල කාලය වසර 6 ක් විය. ව්‍යවස්ථාදායක සභා අඩුම වශයෙන් අවුරුද්දකට වරක්වත් රැස්විය යුතු විය.

  ව්‍යවස්ථා නියමයන්ට අනුව ව්‍යවස්ථාදායක සභා නියමිත නිල කාලයට පෙර විසුරුවා හැරීමට හැකි වූ අතර ඒ සඳහා අවශ්‍ය වූයේ අගමැතිවරයා විසින් එසේ කරන ලෙස නාමික විධායකයෙන් ඉල්ලා සිටීම පමණි.
- පැවරී තිබුන බලතල අනුව බලන විට ව්‍යවස්ථාදායක දෙක එකිනෙකින් බෙහෙවින්ම වෙනස් විය. ව්‍යවස්ථාදායක බලය යනුවෙන් අදහස් කරන්නේ නීති සම්පාදනයට ඇති බලයයි. සෝල්බරි ව්‍යවස්තාවේ 29(1) වගන්තිය අනුව දිවයිනේ සාමය, ආරක්ෂාව සහ යහපාලනය සඳහා නීති පැනවීමට පාර්ලිමේන්තුවට බලය තිබුනි. මෙසේ සඳහන් වුවත් පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය කෙරෙහි සීමා පැනවෙන විධිවිධාන තුනක් සෝල්බරි ව්‍යවස්ථාවේ අඩංගු විය. ඒවා නම්;

  (1). 29(2) වගන්තියේ **'අ'- (ඇ) අනු වගන්ති**

  (අ). යම් ආගමක් නිදහසේ ඇදහීම තහනම් කරන හෝ සීමාකරන නීතියක් හෝ;

  (ආ). යම් ප්‍රජාවකට හෝ ආගමකට අයත් පුද්ගලයින්ට වෙනත් ප්‍රජාවකට හෝ ආගමකට අයත් පුද්ගලයින්ට බල නොපාන සීමාවන්ට යටත් කරනු ලබන නීතියක් හෝ;

  (ඇ). යම් ප්‍රජාවකට හෝ ආගමකට අයත් පුද්ගලයින්ට ලබා දී නැති වරප්‍රසාදයක් හෝ වාසියක් වෙනත් ප්‍රජාවකට හෝ අයත් පුද්ගලයින්ට ලබාදෙන නීතියක් හෝ;

  (ඈ). යම් ආගමික ආයතනයක පාලක මණ්ඩලයේ අනුමැතිය නැතිව එම ආතනයේ සංයුතිය වෙනස් කරන නීතියක් පැනවීමේ බලය පාර්ලිමේන්තුවට අහිමි වන අතර මෙයට පටහැනිව පනවන නීතියක් වේ නම් 29(3) වගන්තිය ප්‍රකාරව ශූන්‍ය වේ.

  (2). **අධිකරණ විවරණ බලය**

  - මෙයින් අදහස් කරන්නේ ව්‍යවස්ථාදායකය පනවන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වනවාද නැද්ද යන්න පරීක්ෂා කර බැලීමටත් අනුකූල නොවනවා නම් එම නීති අවලංගු කිරීමටත් අධිකරණයට ඇති බලයයි. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ මෙම බලය පළමුවෙන් ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයටත් අවසාන වශයෙන් බ්‍රිතාන්‍යයේ රාජාධිකරණයටත් හිමිව තිබුණි. මෙම බලය සම්බන්ධයෙන් දැක්විය හැකි හොඳම නිදසුන 1962 දී ප්‍රකාශයට පත්කළ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ නඩුවේ තීන්දුවයි.

(3). **සෝල්බරි ව්‍යවස්ථාවේ 2 වන වගන්තිය**

- ලංකා පාර්ලිමේන්තුව ඉල්ලා සිටිනම් ලංකාව වෙනුවෙන් නීති පැනවීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට බලය තිබෙන බව මෙම වගන්තියෙන් ප්‍රකාශ විය.

- ඉහත සඳහන් විධිවිධාන මගින් සෝල්බරි පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය සීමා කරනු ලැබූ අතර පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යයටද එමගින් හානි සිදුවිය.
- 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව ස්ථාපිත කර තිබුණේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය න්‍යාය පදනම් කර ගෙනය. මෙම න්‍යායෙන් ප්‍රකාශ වන්නේ පාර්ලිමේන්තුවේ බලය අසහාය වන බවත් එයට සමාන වන හෝ අභියෝග කළහැකි වෙනත් බලයක් නොමැති බවත්, එම බලය පදනම් කරගෙන පාර්ලිමේන්තුවට ඕනෑම නීතියක් පැනවිය හැකි බවත්, එම නීති කිසිදු අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක්කළ නොහැකි බවත් සහ පාර්ලිමේන්තුවේ බලය සීමා කරන නීති පැනවීමට කිසිදු වෙනත් කිසිදු ආයතනයට බලය නොමැති බවත්ය.
- මේ අනුව ජාතික රාජ්‍ය සභාවට ඕනෑම නීතියක් පැනවීමට සහ අහෝසි කිරීමට බලය හිමි වූ අතර මෙම තත්ත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4, 5, 44, 45 සහ 48.2 යන වගන්ති මගින් තහවුරු කර තිබුණි. මෙම වගන්ති මගින් කියවුනේ ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව සතුවන බවත්, එම බලය ජනතාව විසින් ජාතික රාජ්‍ය සභාව හරහා ක්‍රියාවට නංවන බවත්, ඒ අනුව ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලය උත්තරීතර වන බවත් සහ ජාතික රාජ්‍ය සභාවට ඕනෑම නීතියක් පැනවිය හැකි බවත්, එම නීති කිසිදු අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක්කළ නොහැකි බවත්ය.
- 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන පනත් වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්‍ෂා කර බැලීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට හිමි වුවද පනත සම්මත කොට නීතියක් බවට පත් වූ පසු ඒ ගැන ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට විනිශ්චය බලයක් හිමි නොවීය.
- මේ අනුව සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව මෙන් නොව 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව නීති පැනවීම සම්බන්ධයෙන් උත්තරීතර බලයක් භුක්ති වින්දේය.

**නිගමණය**

ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන්නේ 1948 සහ 1972 ව්‍යවස්ථා යටතේ ක්‍රියාත්මක වූයේ කැබිනට් මාදිලියේ ආණ්ඩුක්‍රමයක් වූවද එම ව්‍යවස්ථා දෙක යටතේ ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාදායක මණ්ඩල දෙක සංවිධාන ව්‍යුහය, සංයුතිය සහ බලතල යන සෑම ක්‍ෂෙත්‍රයකින්ම අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට වෙනස් වන බවය.

8. **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද පහත දැක්වෙන සංශෝධන අතුරෙන් ඕනෑම දෙකක් තෝරාගෙන ඒවායේ මූලික අංග ලක්‍ෂණ සඳහන් කරන්න.**

**(1). 2001 වර්ෂයේ 17 වන ව්‍යවස්ථා සංශෝධනය**
**(11). 2010 වර්ෂයේ 18 වන ව්‍යවස්ථා සංශෝධනය**
**(111). 2015 වර්ෂයේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය**

**(1). 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය**

- **අභිමථාර්තය**

1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්තාව යටතේ ගොඩ නැගූ විධායක ජනාධිපති තනතුර සම්බන්ධයෙන් එල්ල වී ඇති ප්‍රධානම විවේචනය වන්නේ එය වූ කලී ප්‍රජාතන්ත්‍රවාදී සළුපිලි වලින් ආවරණය කළ ඒකාධිපති තනතුරක් වන බවය, විශෙෂයෙන්ම රජයේ උසස් තනතුරු සඳහා පත්කිරීම් කිරීම සම්බන්ධයෙන් ජනාධිපති වරයාට පවරා තිබුන අභිමතානුසාරී බලය ක්‍රියාවට නැංවීමේදී පෙනීගියේ ජනාධිපතිවරුන් හිතුවක්කාරී

සහ අත්තනෝමතික ලෙස එම බලතල ක්‍රියාවට නැංවීම හේතුවෙන් රාජ්‍ය සේවය, අධිකරණය හා පොලීසිය යන රාජ්‍ය සේවාවන්හි ස්වාධීනත්වය සහ අපක්ෂපාතීභාවය නැතිව ගොස් ඒවා වේගයෙන් දේශපාලනීකරණය වෙමින් පවතින බවය. මෙම තත්ත්වය සංවරණය කිරීමේ අරමුණෙනුයි 2001 වර්ෂයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 17 වන සංශෝධනය ඇතුල් කරන්නේ. මෙම ප්‍රශ්නයේ අභිමථාර්තය වන්නේ 17 වන ව්‍යවස්ථා සංශෝධනය පැනවීමේ ව්‍යවස්ථාමය පසුබිම සහ එම සංශෝධනයේ අන්තර්ගත මූලික සංවරණ විධික්‍රම පිළබඳව අපේක්ෂයින්ගේ දැනුම හා අවබෝධය මැන බැලීමය.

**පිළිතුර තුළ අඩංගු වියයුතු මූලික කරුණු**

**(අ). 17 වන ව්‍යවස්ථා සංශෝධනයට බලපෑ ව්‍යවස්ථාමය පසුබිම ලකුණු 03**
**(ආ). 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ මූලිකාංග ලකුණු 05**
**(ඇ). නිගමනය ලකුණු 02**

**ආදර්ශ පිළිතුර**

- 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සංස්ථාපනය කළ විධායක ජනාධිපති ධුරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් ප්‍රජාතන්ත්‍රවාදය නමැති කඩතුරාවට මුවා වී ගොඩ නගන ලද බරපතල ආඥාදායකත්වයක් වන බවට එම තනතුර හඳුන්වා දුන් දිනයේ සිටම චෝදනා එල්ල වේ.
- විශේෂයෙන්ම විචාරකයින්ගේ දැඩි විවේචනයට ලක්වූයේ රජයේ උසස් නිලතල සඳහා පත්කිරීම් කිරීමට සංවරණයකින් තොරව ජනාධිපතිවරයාට පවරා දී තිබූ අධි බලයයි.
- 1978 සිට තනතුරට පත් වූ ජනාධිපතිවරුන් විසින් මෙම බලතල භයානක ලෙස අවභාවිත කිරීමට පෙළඹෙන අතර මෙහි ප්‍රතිඵලය වූයේ රාජ්‍ය සේවාව, පොලීසිය සහ අධිකරණය වේගයෙන් දේශපාලණීකරනය වෙමින් එවායේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතීභාවය නැතිවී යාමය.
- මෙම අත්දැකීම් මගින් පෙනීගියේ ඇති වී තිබෙන තත්ත්වය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට බෙහෙවින්ම අහිතකර බවත් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය යටපත් කරමින් වේගයෙන් රට තුළ ආඥාදායක ආණ්ඩුක්‍රමයක් බිහිවෙමින් පවතින බවත්ය.
- මෙම තත්ත්වය පාලනය කරමින් රාජ්‍ය සේවයේ, පොලීසියේ හා අධිකරණ ක්‍රමයේ ස්වාධීනත්වය ආරක්ෂා කොට පවත්වා ගෙන යාමට මෙන්ම මැතිවරණ ක්‍රියාවලිය ස්වාධීනව පවත්වා ගෙනයාම සඳහා ද ජනාධිපතිවරයාගේ සමහර විධායක බලතල සංවරණය කිරීමට යටත් කළයුතු බව පැහැදිලිවම පෙනී ගියේය.
- මෙම අරමුණ ඉලක්ක කර 2001 ඔක්තෝම්බර් මස තුන්වන දින 17 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීය. මෙම සංශෝධනයේ විශේෂත්වය වන්නේ පාර්ලිමේන්තුව නියෝජනය කළ සියලුම දේශපාලන පක්ෂ ඒකඡන්දයෙන් යෝජනාව අනුමත කිරීමය.
- 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ව්‍යවස්ථාවට කරන ලද මූලික වෙනස්කම් පහත සඳහන් පරිදි වේ.

    1. විධායක ජනාධිපතිවරයාගේ තීරණ ගැනීමේ බලයට සීමා පැනවෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීම. කොමිසම සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත විය. කථානායකවරයා සභාපති විය. අගමැතිවරයා, විරුද්ධ පක්ෂයේ නායකයා, ජනාධිපතිවරයාගේ නියෝජිතයෙකු, අගමැති සහ විරුද්ධ පක්ෂයේ නායකයා විසින් නම් කල ජනාධිපතිවරයා විසින් පත්කරන පස් දෙනෙකු සහ පාර්ලිමේනතුවේ කුඩා පක්ෂ විසින් පත් කරන එක් අයෙකු, අනෙක් සාමාජිකයින් විය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පැවරුන කාර්යයන් දෙකක් විය.

(1). ස්වාධීන කොමිෂන් සභා සඳහා පත්කළ යුතු අයගේ නම් ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම. එම කොමිෂන් සභා වූයේ;

(අ). මැතිවරණ කොමිෂන් සභාව
(ආ). රාජ්‍ය සේවා කොමිෂන් සභාව
(ඇ). ජාතික පොලිස් කොමිෂන් සභාව
(ඈ). ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
(ඉ). අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව
(ඊ). මුදල් කොමිෂන් සභාව
(උ). සීමා නීර්ණය කොමිෂන් සභාව

(2). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කළයුතු පත්කිරීම්
(අ). අගවිනිසුරු හා ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙක් විනිශ්චයකරුවන්
(ආ). අභියාචනාධිකරණයේ සභාපති සහ අනෙක් විනිසුරුවරුන්
(ඇ). අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්
(ඈ). නීතිපතිවරයා
(ඉ). විගණකාධිපතිවරයා
(ඊ). පොලිස්පතිවරයා
(උ). ඔම්බුඩ්ස්මන්වරයා
(ඌ). පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා

2. එතෙක් පැවති සමහර කොමිෂන් සභා සඳහා අතිරේක බලතල ලබාදීම. නිද. අධිකරණ සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

3. පරිපාලන විනිශ්චය සභාව නමැති ආයතනය පිහිටුවීම

4. නව කොමිෂන් සභා කිහිපයක් පිහිටුවීම. ජාතික පොලිස් කොමිෂන් සභාව සහ මැතිවරණ කොමිෂන් සභාව.

**නිගමනය**

ඉහත දැක්වූයේ 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ මූලිකාංගයන් ය. නමුත් දේශපාලන හේතූන් නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි විය. සංශෝධනයෙන් පිහිටවූ වැදගත්ම ආයතනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සාමාජිකයින් පත් නොකිරීම හේතුවෙන් 2005 වර්ෂය වනවිට මුළුමණින්ම අක්‍රීය තත්ත්වයකට පත්ව තිබුණි. මැතිවරණ කොමිසම කිසිදු දිනක පත් නො කළේය.

(11). **2010 වර්ෂයේ 18 වන ව්‍යවස්ථා සංශෝධනය**

- **අභිමථාර්තය**

2010 වර්ෂයේදී ව්‍යවස්ථාවට කරන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් 17 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයා කෙරෙහි පැනවූ සියළුම සංවරණ ඉවත් කර 1978 මූලික ව්‍යවස්ථාවේ අන්තර්ගත සමහර වගන්ති ද වෙනස් කෙරිණ. විචාරකයින් මෙම සංශෝධනය හැඳින්වූයේ ආඥාදායකත්වයෙන් අධි ආඥාදායකත්වයක් කරා යාමට ගත් උත්සාහයක් ලෙසය. මෙම ප්‍රශ්නයේ අභිමථාර්තය වන්නේ මෙම තත්ත්වය සම්බන්ධයෙන් අපේක්ෂකයින් දරන මතය පරීක්ෂාවට ලක් කිරීමය.

- **පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු**

| | |
|---|---|
| **(අ). 18 වන සංශෝධනයේ මූලිකාංග** | **ලකුණු 05** |
| **(ආ). 18 වන සංශෝධනයේ ප්‍රතිඵල** | **ලකුණු 03** |
| **(ඇ). නිගමනය** | **ලකුණු 02** |

**ආදර්ශ පිළිතුර**

- 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව විසින් සම්මත කොට කථානායකවරයා අවසාන අනුමැතිය දුන්නේ 2010 සැප්තැම්බර් 08 දිනය.
  සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික වෙනස්කම් තුනක් කරන ලදි.
  (1). ජනාධිපති තනතුරට තරඟ කිරීම සම්බන්ධයෙන් පනවා තිබූ වාර දෙකක සීමාව ඉවත් කිරීම.
  (2). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවා තිබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කොට ඒ වෙනුවට බල විරහිත පාර්ලිමේන්තු සභාව පිහිටුවා ජනාධිපතිවරයාගේ බලතල පුළුල් කිරීම.
  (3). ස්වාධීන කොමිෂන් සභාවල බලතල කප්පාදු කිරීම.

**පාර්ලිමේන්තු සභාව**

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කොට ඒ වෙනුවට 18 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටවූයේ පාර්ලිමේන්තු සභාවය. එය සමන්විත වූයේ පහත දැක්වෙන සාමාජිකයින් පස් දෙනාගෙනි.
  1. අගමැතිවරයා
  2. කථානායකවරයා
  3. විරුද්ධ පක්ෂයේ නායකවරයා
  4. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන අගමැති නම් කරන අයෙක්
  5. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන විපක්ෂ නායකයා නම් කරන අයෙක්
- කලින් පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමග පාර්ලිමේන්තු සභාව සසඳන විට මූලික වෙනස්කම් දෙකක් දැකිය හැකිවිය.
  (1). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සාමාජිකයින් 10 දෙනාගෙන් 07 දෙනෙක්ම පාර්ලිමේන්තුව නියෝජනය නොකළ සිවිල් පුද්ගලයින් විය. නමුත් පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයින් පස් දෙනාම පාර්ලිමේන්තු සාමාජිකයින් විය.
  (11). ජනාධිපතිවරයා කරන පත්කිරීම් සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට සහ අනුමත කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව භුක්ති වින්ද බලය පාර්ලිමේන්තු සභාවට අහිමි කිරීම.

- 18 වන සංශෝධනයට අනුව;
  (අ). මැතිවරණ කොමිෂන් සභාව
  (ආ). රාජ්‍ය සේවා කොමිෂන් සභාව
  (ඇ). ජාතික පොලිස් කොමිෂන් සභාව
  (ඈ). ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
  (ඉ). අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව
  (ඊ). මුදල් කොමිෂන් සභාව
  (උ). සීමා නිර්ණය කොමිෂන් සභාව

  යනාදියට සාමාජිකයින් පත්කිරීමේදී ජනාධිපතිවරයා පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිය යුතුය. එමෙන්ම;

  (අ). අගවිනිසුරු හා ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙක් විනිශ්චයකරුවන්
  (ආ). අභියාචනාධිකරණයේ සභාපති සහ අනෙක් විනිසුරුවරුන්
  (ඇ). අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්
  (ඈ). නීතිපතිවරයා
  (ඉ). විගණකාධිපතිවරයා
  (ඊ). ඔම්බුඩ්ස්මන්වරයා
  (උ). පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා

  පත්කිරීමේදී ජනාධිපතිවරයා පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිය යුතුය.

- නිරීක්ෂණ ඉල්ලා සිටියද, පාර්ලිමේන්තු සභාව ඒ අනුව නිරීක්ෂණ ලබා දුන්නද ඒවායින් බැඳීමක් ජනාධිපතිවරයාට නොවීය. නිරීක්ෂණ නොසළකා හරිමින් ජනාධිපතිවරයාගේ අභිමතය අනුව තමන්ට අවශ්‍ය පරිදි මෙම පත්කිරීම් කිරීමට ජනාධිපතිවරයාට හැකිවිය.

- 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් පොලිස්පතිවරයා පත්කළ යුතු වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්වය. නමුත් 18 වන සංශෝධනය යටතේ එම සීමාව අයින් කොට පොලිස්පතිවරයා පත්කිරීම සෘජුවම ජනාධිපතිවරයා යටතට අයත් කර ගත්තේය.

  18 වන සංශෝධනය යටතේ කරන ලද තවත් බරපතල වෙනස්කමක් වූයේ ස්වාධීන කොමිෂන් සභා වලට හිමිකර දී තිබූ බලතල ඉතාම දැඩි ලෙස කප්පාදු කිරීමය. මේ අනුව මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව යන ආයතන වල බලතල අසීමිත ලෙස කප්පාදු කරන ලදි.

- මේ අතුරින් ඉතාම බරපතල කරුණ වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුව පැවති බලතල කප්පාදු කිරීමය. 17 වන සංශෝධනයට අනුව 'රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම ඇතුළු රජයේ නිලධරයන්ට අදාල සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සකස් කිරීම පිළිබඳ බලය තිබුනේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටය. නමුත් 17 වන සංශෝධනය යටතේ මේ බලතල අමාත්‍ය මණ්ඩලය වෙත පවරා ගනු ලැබීය.

- මෙයට අමතරව 17 වන සංශෝධනය යටතේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම, උසස් කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම යන කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිසමට පවරා තිබුන අමාත්‍ය මණ්ඩලයට උපදෙස් දීමේ බලය 18 වන සංශෝධනය යටතේ කෙළින්ම අමාත්‍ය මණ්ඩලය යටතට පවරා ගනු ලැබීය.

**නිගමණය**

ඉහතින් දැකවූයේ 18 වන සංශෝධනය යටතේ කරන ලද ව්‍යවස්ථාමය වෙනස් කිරීම් පිළිබඳ සාරාංශයක්ය. මෙම සංශෝධනය ප්‍රජතන්ත්‍රවාදීන් අර්ථකතනය කළේ ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරන ලද මරු පහරක් ලෙසය. විවේචකයින් පෙන්වා දුන්නේ මෙම සංශෝධනයේ බලපෑමෙන් ස්වාධීන රාජ්‍ය සේවය බිඳ වැටුන බවය. අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය බිඳ වැටුන බවය. ව්‍යවස්ථාදායකය විධායකයේ ග්‍රහණයට හසු වූ බවය. ස්වාධීන මැතිවරණ ක්‍රමය බිඳ වැටුන බවය. සමස්ථයක් ලෙස ගත්විට ප්‍රජාතන්ත්‍රවාදය බරලතල බාදනයකට ගොදුරු වූ බවය. මෙම චෝදනා වල සත්‍ය අසත්‍ය තත්ත්වය කෙසේ වෙතත් 18 වන ව්‍යවස්ථා සංශෝධනය ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිවිරෝධතාවක් බව අවසාන වශයෙන් කිව හැක.

(111). **2015 වර්ෂයේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය**

- **අභිමථාර්ථය**

18 වන සංශෝධනය රට තුළ අපේක්ෂා කළ පරිදිම බරපතල දේශපාලන අර්බුදයක් ඇතිවීම කෙරෙහි ඉතාම දැඩි ලෙස බලපෑවේය. පැහැදිලිවම පෙනීගියේ රට තුළ විධායක ආඥාදායකත්වයක් ගොඩ නැගෙමින් පවතින බවය. රාජ්‍ය සේවය, පොලීසිය සහ අධිකරණය බලා සිටියදී ම විධායකයේ අතකොළු බවට පත්වන තත්ත්වයක් දැකිය හැකි විය. මෙයට සමාන්තරව රටේ දූෂණ හා වංචා ද දිනෙන් දින ඉහල යාමට පටන් ගත්තේය. ආණ්ඩුවට එරෙහිව සිවිල් සමාජ විරෝධය දිනෙන් දිනම උග්‍ර ලෙස නැගී එන්නට විය. 2015 ජනවාරි මාසයේ පැවැත්වූ ජනාධිපතිවරණයේදී බලයේ සිටි ජනාධිපතිවරයා පරාජයට පත් වී නව ජනාධිපතිවරයෙකු තේරී පත් වන්නේ මෙම අර්බුදය හමුවේ නව ජනාධිපතිවරයා සහ නව ආණ්ඩුව විසින් ඉදිරිපත් කළ දින 100 වැඩ සටහනේ ප්‍රමුඛස්ථානය ගත් කරුණක් වූයේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී යහපාලනය ස්ථාපිත කිරීමය.

මෙම ක්‍රියාදාමයේ ආරම්භක අවස්ථාව ලෙස 2015 මැයි මාසයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වන ව්‍යවස්ථා සංශෝධනය පෙන්වා දීමට පුළුවන. මෙම ප්‍රශ්නයේ අභිමථාර්ථය වන්නේ ඉහතින් සඳහන් කල ආකාරයට 19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම කෙරෙහි බලපෑ පසුබිම සහ 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් කරන ලද ව්‍යවස්ථාමය වෙනස්කම් පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

- **පිළිතුරෙහි අන්තර්ගත වියයුතු මූලික කරුණු**

| | |
|---|---|
| **(අ). 19 වන සංශෝධනයේ දේශපාලන පසුබිම** | **ලකුණු 02** |
| **(ආ). 19 වන සංශෝධනයේ අන්තර්ගතය** | **ලකුණු 06** |
| **(ඇ). නිගමනය** | **ලකුණු 02** |

**ආදර්ශ පිළිතුර**

- 17 වන සංශෝධනය මගින් උත්සාහ ගත්තේ 1978 ව්‍යවස්ථාව මගින් නිර්මාණය කළ විධායක ආඥාදායකත්වය පාලනය කිරීමටය. 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් කළේ එම උත්සාහය ආපස්සට හැරවීමය. මෙහි ප්‍රතිඵලය වූයේ රට තුළ විධායක ආඥාදායකත්වයක් වර්ධනය වීමට පටන් ගැනීමය.
- පැහැදිලිවම පෙනීගිය දෙය වූයේ වර්ධනය වන විධායක ආඥාදායකත්වය යටතේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම පද්ධතිය ද බාදනය වෙමින් පවතින බවය.
- මෙම තත්ත්වය පාලන කරමින් රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කොට පවත්වා ගෙනයාමේ අරමුණෙන් 2015 ජනවාරි මාසයේ බලයට පත්වන යහපාලන ආණ්ඩුව විසින් 19 වන සංශෝධනය ඉදිරිපත් කරනු ලැබීය.
- 19 වන සංශෝධනය මගින් කරන ලද ප්‍රධාන වෙනස්කම් පහත සඳහන් පරිදි වේ.

1. තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම හඳුන්වා දීම.
2. ජනාධිපතිවරයාගේ ධූර කාලය වසර 5 දක්වා අඩු කිරීම.
3. ජනාධිපති තනතුර එක් පුද්ගලයෙකුට දැරිය හැක්කේ දෙවතාවක් පමණක්ය යන විධිවිධානය යළි බලාත්මක කිරීම.

4. බලයේ සිටින ජනාධිපති මියගිය හොත් හෝ ධුරය හිස්වීමක් සිදුවුව හොත් වැඩබලන ජනාධිපති ධුරයක් පිළිබඳ ප්‍රතිපාදන.
5. ජනාධිපතිවරයා වෙත අතිරේක වගකීම් පැවරීම.
6. ජනාධිපතිවරයාගේ මුක්තිය සීමා කිරීම.
7. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත හඳුන්වා දීම. මේ හරහා කොමිෂන් සභා සඳහා සාමාජිකයින් පත් කිරීම හා ඉහළ නිලධාරීන් හා විනිශ්චයකාරවරුන් ජනාධිපතිවරයාට තිබූ බලතල සීමා කිරීම.
8. කැබිනට් අමාත්‍යවරුන්ගේ උපරිම සීමාවක් පිළිබඳ ප්‍රතිපාදන හඳුන්වා දීම.
9. පාර්ලිමේන්තුවේ නිල කාලය අඩු කිරීම.
10. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට තිබූ බලතල සංශෝධනය කිරීම.
11. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වීමේ බලතල ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දීම.
12. හදිසි පනත් පිළිබඳ ප්‍රතිපාදන අහෝසි කිරීම.
13. විගණන කොමිසම සහ ප්‍රසම්පාදන කොමිසම හඳුන්වා දීම.
14. මැතිවරණ කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන ඒවායේ බලතල වැඩි කිරීම.
15. විදේශ රටක පුරවැසිභාවය ලත් පුද්ගලයෙකුට පාර්ලිමේන්තු මහ මැතිවරණයකදී හෝ ජනාධිපතිවරණයකදී තරග කළ නොහැකි පරිදි නීති සම්පාදනය.

**නිගමනය**

ඉහත දැක්වූයේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම කෙරෙහි බලපෑ දේශපාලන පසුබිම සහ 19 වන සංශොධනයෙන් කරන ලද වෙනස්කම්ය. මෙම සංශෝධනයේ ප්‍රතිඵල ලෙස විධායක ජනාධිපති ධුරයේ අත්තනෝමතික බලතල සීමාවීම, රාජ්‍යයේ විනිවිදභාවය හා වගවීම වර්ධනය වීම සහ පුරවැසියන් සවිබලගැන්වීම යනාදිය පෙන්වා දියහැක.